# භූගෝල විද්‍යාව

## 6 ශ්‍රේණිය

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය - 2014
දෙවන මුද්‍රණය - 2015
තුන්වන මුද්‍රණය - 2016
සිව්වන මුද්‍රණය - 2017
පස්වන මුද්‍රණය - 2018
හයවන මුද්‍රණය - 2019
හත්වන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-25-0259-0

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

Published by: Educational Publications Department
Printed by: State Printing Corporation

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා  ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති  අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ  අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ  අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ මාතා

තිළිණය ලෙසින් රජයෙන් මේ පොත ලදිමි
කියවා එයින් නැණ ගුණ එළි කර ගනිමි
මගෙ රට වෙනුවෙන් ම දෑ සම්පත් රකිමි
මේ පොත එන වසරෙ වෙන කෙනකුට පුදමි

**அரசின் வெகுமதியாய் நூலிதனைப் பெற்றேன்**
**அறிவு பெருகிடவே நூலிதனைக் கற்பேன்**
**தாய் நாட்டின் வளமெனவும் நூலிதனைக் காப்பேன்**
**பல மாணவரும் பயின்றிடவே நூலிதையே அளிப்பேன்**

From the government, I received this as a gift
I’ll read it, light up my knowledge and practise thrift
On my country’s own behalf, I’ll protect the national resources
And offer this book to another one as a fresh garland of roses

# පෙරවදන

ලෝකය දිනෙන් දින සංවර්ධනය කරා පියමනින විට අධ්‍යාපන ක්ෂේත්‍රය ද සැමවිටම අලුත් වෙයි. එබැවින් අනාගත අභියෝග සඳහා සාර්ථක ලෙස මුහුණ දිය හැකි ශිෂ්‍ය ප්‍රජාවක් බිහිකරලීමට නම් අපගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද නිරතුරුව සාධනීය ප්‍රවේශ වෙත ළඟාවිය යුතු ය. එයට සවියක් වෙමින් නවලොව දැනුම සමීප කරන අතරම, යහගුණයෙන් පිරිපුන් විශ්වීය පුරවැසියන් නිර්මාණය කිරීමට සහයවීම අපගේ වගකීම වේ. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යයෙහි සක්‍රිය ලෙස ව්‍යාවෘත වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ සඳහා දායක වනුයේ දැයේ දරුවන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොතක් යනු දැනුම පිරි ගබඩාවකි. එය විටෙක අප වින්දනාත්මක ලොවකට කැඳවාගෙන යන අතරම තර්ක බුද්ධිය ද වඩවාලයි. සැඟවුණු විභව්‍යතා විකසිත කරවයි. අනාගතයේ දිනෙක, මේ පෙළපොත් හා සබැඳි ඇතැම් මතක, ඔබට සුවයක් ගෙන දෙනු ඇත. මේ අනගි ඉගෙනුම් උපකරණයෙන් ඔබ නිසි පල ලබාගන්නා අතරම තව තවත් යහපත් දැනුම් අවකාශ වෙත සමීප වීම ද අනිවාර්යයෙන් සිදු කළ යුතු ය. නිදහස් අධ්‍යාපනයේ මහරු තිළිණයක් ලෙස නොමිලේ මේ පොත ඔබේ දෝතට පිරිනැමේ. පාඨ ග්‍රන්ථ වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පෙළපොත හොඳින් පරිශීලනය කර නැණ ගුණ පිරි පුරවැසියන් වී හෙට ලොව එළිය කරන්නට ඔබ සැමට දිරිය සවිය ලැබෙන්නැයි සුබ පතමි.

මෙම පෙළපොත් සම්පාදන සත්කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ ප්‍රණාමය පළකරමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2020. 06. 26

**නියාමනය හා අධීක්ෂණය** - පී. එන්. අයිලප්පෙරුම
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම** - ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය** - ඒ. එම්. ආර්. කේ. අධිකාරි
නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සංස්කාරක මණ්ඩලය

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. කේ. දන්ගල්ල (විශ්‍රාමික) - කැලණිය විශ්වවිද්‍යාලය
2. මහාචාර්ය එස්. ඒ. නෝබට් - කොළඹ විශ්වවිද්‍යාලය
3. ආර්. පී. පීරිස් - අතිරේක කොමසාරිස් (විශ්‍රාමික) විභාග දෙපාර්තමේන්තුව
4. එච්. දහනායක - ප්‍රධාන සංස්කාරක (විශ්‍රාමික) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
5. ආර්. ඒ. ඩී. නන්දනී රූපසිංහ - නියෝජ්‍ය කොමසාරිස් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. රංජනී ධනවර්ධන - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
7. එස්. කරුණාගරන් - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

## ලේඛක මණ්ඩලය

1. ඩබ්. කාන්ති පෙරේරා ධර්මවර්ධන - ගුරු සේවය, සාන්ත පීතර ම.ම.වි, මීගමුව
2. ඩබ්. ශ්‍යාමණී පෙරේරා ධර්මවර්ධන - ගුරු සේවය, ශුද්ධ වූ පවුලේ බාලිකා ම.වි, වෙන්නප්පුව

3. ආර්. එම්. සෝමාවතී - ගුරු උපදේශක,
කලාප අධ්‍යාපන කාර්යාලය,
බණ්ඩාරවෙල

4. කේ. සෝමදාස - ගුරු උපදේශක,
කලාප අධ්‍යාපන කාර්යාලය,
මාතර

5. ඩී. ටී. සී. විජේවර්ධන - ගුරු සේවය,
ශුද්ධ වූ පවුලේ බාලිකා ම.වි,
වෙන්නප්පුව

6. ඒ. එස්. එම්. ෆරීඩා - ගුරු සේවය,
මුස්ලිම් කාන්තා විද්‍යාලය,
කොළඹ 04

7. යාලිනී කරුණාගරන් - ගුරු සේවය,
සාන්ත ක්ලෙයාර්ස් විද්‍යාලය,
කොළඹ 06

## භාෂා සංස්කරණය

ඔසඳ ගුණරත්න - කොළඹ විශ්වවිද්‍යාලය

## පිටකවර නිර්මාණය

ආර්. ඒ. යුරේකා දිල්රුක්ෂි - තොරතුරු තාක්ෂණ අංශය,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## පරිගණක අක්ෂර සංයෝජනය
## (සිතියම්, රූපසටහන් සහ පරිගණක පිටු සැකසුම)

1. ආර්. ඒ. යුරේකා දිල්රුක්ෂි - තොරතුරු තාක්ෂණ අංශය,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

2. වී. ජී. ඩයනා දිල්රුක්ෂි - සංවර්ධන නිලධාරි,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


| | | |
|---|---|---|
| | | පිටුව |
| 1. | පාසල හා අවට වටපිටාව | 01 |
| | පාසලක පිහිටීම හඳුනා ගැනීම | 01 |
| | පාසල හා අවට වටපිටාවේ කාලගුණය | 10 |
| | පාසල අවට වටපිටාවේ භූ දර්ශනය | 18 |
| 2. | නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය | 22 |
| | ශාක හා සත්ත්ව විවිධත්වය | 24 |
| | පාසල/ නිවස අවට වටපිටාවේ මානව ක්‍රියාකාරකම් | 28 |
| 3. | තම නිවස අවට වටපිටාව යහපත්ව පවත්වා ගැනීම | 37 |
| | අපද්‍රව්‍ය බැහැර කිරීම | 52 |
| 4. | ශ්‍රී ලංකාවේ පිහිටීම | 55 |
| | ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන | 58 |
| | ලෝකයේ වෙනත් දූපත් | 61 |

# ලේඛක/සංස්කාරක මණ්ඩල සටහන

හය වන ශ්‍රේණියේ සිට භූගෝල විද්‍යාව ඉගෙනීම ආරම්භ කරන ඔබට පළමුවෙන් ම ඔබ පාසල හා නිවස අවට පරිසරය පිළිබඳවත්, අපේ රට පිළිබඳවත්, සරල ව ඉගෙනීමට අවස්ථාව සලසා දීම සඳහා මෙම පෙළපොත සම්පාදනය කර ඇත.

පාසල හා නිවස අවට පරිසරය යටතේ දක්වා ඇති එහි පිහිටීම, භූ දර්ශනය, කාලගුණ තොරතුරු, සත්ත්ව හා ශාක ප්‍රජාව හා ප්‍රදේශවාසීන්ගේ ජීවන කටයුතු පිළිබඳ තොරතුරු ඔබට ආසන්න හා හුරුපුරුදු ඒවා වේ. එම තොරතුරු ඉගෙනගන්නා අතර, අවට පරිසරය සුරැකීම හා එහි තිරසර භාවිතය පිළිබඳවත් කරුණු හැදෑරීමට මෙහි දී ඔබේ අවධානය යොමු කෙරේ.

භූගෝල විද්‍යාවට අවශ්‍ය වන සිතියම් පිළිබඳ මූලික සංකල්ප ගොඩනගා ගැනීමට ඔබට මෙමගින් අවස්ථාව සපයා තිබේ.

ගුරු මගපෙන්වීම යටතේ, ක්‍රියාත්මක කළ හැකි පැවරුම් හා ක්‍රියාකාරකම්වලට වැදගත් තැනක් හිමිවන පරිදි ලියා ඇති මෙම පෙළපොත පරිශීලනය කරන ඔබට එය ක්‍රියාකාරි වැඩ පොතක් ද වනු ඇත. ඒ සඳහා භූගෝල විද්‍යාවට අදාළ වන චිත්‍ර, ඡායාරූප, සිතියම්, රූප සටහන්, වගු හා සංඛ්‍යා ලේඛන මෙම පොතට ඇතුළත් කර තිබේ.

ක්‍රියාකාරී හා ප්‍රියජනක ඉගෙනුම් වාතාවරණයක් තුළින් මූලික භූගෝල විද්‍යාත්මක දැනුමක් ලබාදීම මෙම පොතේ ප්‍රධාන අරමුණ යි.

මෙම තොරතුරු මැනවින් අධ්‍යයනය කර වසර අවසානයේ දී ඔබත් පරිසරය පිළිබඳ පුංචි භූගෝල විද්‍යාඥයෙක් වීමට අදිටන් කර ගන්න.

# 1 පාසල හා අවට වටපිටාව


සමාජය සතු වටිනා ම සම්පත දරුවා ය. දරුවා කුඩා කාලයේ සිට සිය පවුල තුළ දෙමාපියන් වැඩිහිටියන් ඇසුරින් ජීවිතය හැඩගස්වා ගැනීමට අවශ්‍ය මූලික අධ්‍යාපනය ලබාගනියි. දරුවා වැඩෙත් ම අධ්‍යාපනය ලබා දෙන විධිමත් ආයතනය වන්නේ පාසල යි. ශ්‍රී ලංකාව තුළ පාසල් විශාල සංඛ්‍යාවක් ඇත. ඒවා ග්‍රාමීය, නාගරික, කඳුකර, වෙරළාසන්න ආදී විවිධ පරිසරවල පිහිටා තිබේ.

## පාසලක පිහිටීම හඳුනා ගැනීම

පාසල පිහිටි ගම හෝ නගරය කුමක්දැයි ඔබගෙන් විමසුවහොත් එයට පහසුවෙන් පිළිතුරු දීමට ඔබට පුළුවන. එහෙත් පරිපාලන කොට්ඨාස අනුව ඔබගේ පාසලේ පිහිටීම විමසූ විට එයට පිළිතුරු දීම එතරම් පහසු නොවනු ඇත.

ඔබගේ පාසල පිහිටි ගමේ හෝ නගරයේ පිහිටීම නිවැරදි ව දක්වීමට මගපෙන්වීම මෙම පාඩමෙහි අරමුණ යි.

1.1 රූපය නිරීක්ෂණය කරන්න. පාසල පිහිටා ඇති කුඩා ම පරිපාලන ඒකකය ග්‍රාම නිලධාරි කොට්ඨාසය යි. ගමක් හෝ ගම් කිහිපයක් එකතු වී ග්‍රාම නිලධාරි කොට්ඨාසය සෑදී ඇත. විශාල නගරයක ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයක් තිබීමට පුළුවන. ග්‍රාම නිලධාරි කොට්ඨාසයකට නමක් හා අංකයක් තිබේ. ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයක් එකතු වීමෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එක්වීමෙන් දිස්ත්‍රික්කයක් ද සෑදී ඇත. දිස්ත්‍රික්ක දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් එකතු වී සෑදී ඇති පළාත, ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය යි.





1.1 රූපය
පරිපාලන කොට්ඨාස ධූරාවලිය තුළ ඔබේ පාසලේ පිහිටීම

## ක්‍රියාකාරකම්

ගුරු උපදෙස් ලබා ගනිමින් පාසලේ පිහිටීම පිළිබඳ ව පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරන්න.

1. ඔබේ පාසල පිහිටි,
   - ගම හෝ නගරය
   - ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම හා අංකය
   - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
   - දිස්ත්‍රික්කය
   - පළාත
2. ඔබ ලබා ගත් තොරතුරු ඇසුරින් ඔබගේ පාසලේ පිහිටීම පිළිබඳ ව වාක්‍ය පහක් ලියන්න.

1.1 සිතියම නිරීක්ෂණය කරන්න. දික්වෙල රජයේ විද්‍යාලයේ පිහිටීම එහි X සලකුණින් දක්වා ඇත. මෙවැනි සිතියමක් ඔබ පාසල අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි මහතා/මහත්මියගෙන් ඔබට ද ලබා ගැනීමට පුළුවන.





1.1 සිතියම
ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පාසලේ පිහිටීම

## පැවරුම්

1. ග්‍රාම නිලධාරි මහතා/මහත්මියගෙන් ලබා ගත් සිතියම පිටපත් කරගෙන ඔබගේ පාසල පිහිටි ස්ථානය සලකුණු කරන්න.
2. ඔබගේ පාසල අවට පිහිටි පොදු ස්ථාන පහක් නම් කරන්න.

# ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක පාසලේ පිහිටීම ලකුණු කිරීම

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හා පළාත් 1.2 සිතියමෙන් දැක්වේ.




**1.2 සිතියම**

**ශ්‍රී ලංකාවේ පළාත් හා දිස්ත්‍රික්ක**



3. ර. මු. නී. ස. 190381

## ක්‍රියාකාරකම්

01. 1.2 සිතියම නිරීක්ෂණය කර ශ්‍රී ලංකාවේ පළාත් සහ එක් එක් පළාතට අයත් දිස්ත්‍රික්ක ඇතුළත් වන සේ වගුවක් සකස් කරන්න.

| පළාත | දිස්ත්‍රික්කය |
| --- | --- |
| | |

02. ශ්‍රී ලංකාවේ පළාත් හා දිස්ත්‍රික්ක දැක්වෙන සිතියමක් පිටපත් කර ගන්න. එහි ඔබගේ පාසල පිහිටි පළාත ලා වර්ණයෙන් ද, දිස්ත්‍රික්කය තද වර්ණයෙන් ද, සේයා කර නම් කරන්න.
03. ගුරු උපදෙස් ලබාගෙන පාසල පිහිටි ගම හෝ නගරය, දිස්ත්‍රික්කය තුළ ලකුණු කොට නම් කරන්න.
04. පාසල පිහිටි දිස්ත්‍රික්කයට මායිම් වන සෙසු දිස්ත්‍රික්ක නම් කරන්න.

- සාමාන්‍යයෙන් පාසලක අනන්‍යතාව දැක්වීම සඳහා එහි නම ලිවීමේ දී එය පිහිටි පළාත, දිස්ත්‍රික්කය හෝ අධ්‍යාපන කලාපය, අධ්‍යාපන කොට්ඨාසයේ නම, පාසලේ නම සමග භාවිත කෙරේ. පහත දක්වා ඇති නිදසුන් බලන්න.

| | |
| --- | --- |
| A. ව/හලා/වෙන්/ දික්වෙල ප්‍රාථමික විද්‍යාලය, යෝගියාන | B. යා/මනිපායි හින්දු විද්‍යාලය, මනිපායි, යාපනය |
| A පාසල, වයඹ පළාතේ හලාවත අධ්‍යාපන කලාපයේ වෙන්නප්පුව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටා ඇත. | B පාසල, යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. |

## පැවරුම

ගුරු උපදෙස් ලබාගනිමින් ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල පිහිටි පාසල් පහක නම් ඉහත සඳහන් ආකාරයට ලියන්න.


## පාසල පිහිටි ඉඩමේ හැඩය

1.2 රූපයෙන් දැක්වෙන්නේ පාසල් භූමියක පිහිටීම පෙන්වන චිත්‍රයකි. එහි පාසල් වත්තේ මායිම තාප්පයකින් හා වැටකින් දක්වා ඇත. මායිමෙන් පාසල් වත්තේ හැඩය හඳුනාගත හැකි ය. පාසල් භූමියේ ඇති ගොඩනැගිලි, පාසල ආසන්නයේ ඇති මාර්ග සහ බැංකුවක් ද චිත්‍රයේ දැක්වේ.




**1.2 රූපය**
**පාසල් වත්තක පිහිටීම**


එම පාසල් භූමියෙහි දළ සැලැස්ම (plan) 1.3 රූපයෙන් දැක්වේ. එම සැලැස්මෙහි 6 ශ්‍රේණිය පන්ති කාමරය " X " ලකුණ යොදා පෙන්වා ඇත. පාසල් භූමිය පෙන්නුම් කරන චිත්‍රයෙහි ඇතුළත් සියලු දේ සැලැස්මෙහි ද විවිධ සංකේත යොදා ගනිමින් දක්වා තිබේ. චිත්‍රය හා සැලැස්ම සංසන්දනය කරමින් වෙනස හඳුනා ගන්න.




1.3 රූපය
පාසල් වත්තේ දළ සැලැස්ම

## දිශාව (Direction) හඳුනා ගැනීම

සැලැස්මක් ඇඳීමේ දී දිශාව සටහන් කිරීම ඉතා වැදගත් වේ. නිවැරදි ව දිශාව හඳුනා ගැනීම සඳහා මාලිමා යන්ත්‍රය (compass) උපයෝගි කර ගනු ලැබේ. පාසලේ ඇති මාලිමා යන්ත්‍රය උපයෝගි කරගෙන ඔබගේ පන්ති කාමරය අසල සිට උතුරු දිශාව හඳුනා ගන්න. උතුරු දිශාව හඳුනාගත් පසු අනෙකුත් දිශාවල පිහිටීම ද නිශ්චිත ව හඳුනා ගැනීමට ඔබට හැකි වනු ඇත.




1.4 රූපය
දිශා සටහන

### ක්‍රියාකාරකම

1.4 රූපය නිරීක්ෂණය කර හිස්තැන් පුරවන්න.

1. උතුරු දිශාව හා නැගෙනහිර දිශාව අතර ------------ දිශාව පිහිටා ඇත.
2. නැගෙනහිර හා දකුණ අතර පිහිටියේ ----------- දිශාව යි.
3. ------------- දිශාව දකුණ හා බස්නාහිර අතර පිහිටා ඇත.
4. බස්නාහිර හා උතුර අතර -------------- දිශාව පිහිටා ඇත.

මාලිමා යන්ත්‍රයක් නොමැති අවස්ථාවක උදෑසන හිරු උදවන දිශාව අනුව ද දිශා හඳුනා ගැනීමට ඔබට පුළුවන. එනම්, හිරු උදවන දිශාවට මුහුණලා දෑත් දෙපසට දිගු කර සිටගත් විට, ඔබගේ දකුණු අත විහිදෙන දිශාවෙන් දකුණු දිශාව පෙන්නුම් කෙරෙන අතර ඊට ප්‍රතිවිරුද්ධ දිශාව එනම් ඔබගේ වම් අත විහිදෙන දිශාවෙන් උතුරු දිශාව පෙන්නුම් කෙරේ. ඒ අනුව අනෙකුත් දිශාවන් ද හඳුනා ගැනීමට පුළුවන. මෙවැනි අවස්ථාවක ඔබගේ සෙවනැල්ල ද ඔබ පිටුපසින් දිස්වේ. 1.5 රූපය බලන්න.




1.5 රූපය
දිශාව හඳුනා ගැනීම

### ක්‍රියාකාරකම්

1. 1.3 රූපය ආදර්ශයට ගනිමින් ඔබගේ පාසල් වත්තේ දළ සැලැස්මක් ඇඳ, 6 ශ්‍රේණියේ පන්ති කාමරය සංකේතයක් යොදා පෙන්වන්න.
2. පුස්තකාලය, විද්‍යාගාරය, විදුහල්පති කාර්යාලය වැනි ඔබගේ පාසලට සුවිශේෂී ස්ථාන එම සැලැස්මෙහි ලකුණු කර දක්වන්න.
3. ඔබගේ පන්ති කාමරයේ සිට බලන විට එම ස්ථාන පිහිටා ඇති දිශාවන් නම් කරන්න.

## පාසලේ සිට තෝරාගත් ස්ථාන කිහිපයක, පිහිටි දිශාව පෙන්නුම් කිරීම

දිශාව දක්වන ආකෘති දෙකක් 1.6 රූපයෙන් දැක්වේ.




1.6 රූපය
පාසලේ සිට පොදු ස්ථාන පිහිටා ඇති දිශා

| | | | |
|---|---|---|---|
| B | - බැංකුව | G | - පිට්ටනිය |
| M | - වෙළෙඳපොළ | R | - ජලාශය |
| H | - රෝහල | P | - තැපැල් කාර්යාලය |

**ක්‍රියාකාරකම**

1.6 රූපය නිරීක්ෂණය කර පාසලේ සිට බලන විට කොටුවේ දක්වා ඇති ස්ථාන පිහිටා ඇති දිශා නම් කරන්න.

**පැවරුම්**

1. ගුරු උපදෙස් ලබා ගනිමින් ඔබගේ පාසල අවට ඇති ස්ථානවල පිහිටීම දක්වීම සඳහා 1.6 රූපයේ දැක්වෙන ආකාරයට සැලැස්මක් අඳින්න.

- පළමුව සැලැස්මේ උතුරු දිශාව දක්වන්න.
- ඔබ පාසල අවට පිහිටි පැහැදිලි ව හඳුනාගත හැකි පොදු ස්ථාන කිහිපයක් තෝරා ගෙන ඒවායේ පිහිටීම, දිශාව අනුව සැලැස්මෙහි දක්වන්න.
- එක් එක් ස්ථානයට පාසලේ සිට ඇති දුර දළ වශයෙන් මීටර හෝ කිලෝමීටරවලින් සඳහන් කරන්න.
- ඔබ හඳුනාගත් ස්ථාන පෙන්නුම් කිරීමට යොදගත් සංකේත සුචියකින් ඉදිරිපත් කරන්න.




2. ඉහත දක්වෙන්නේ අන්තර්ජාලයෙන් (Internet) ලබාගත් පාසලක පිහිටීම දක්වෙන සිතියමකි. අන්තර්ජාල පහසුකම් තිබේ නම් ඔබ පාසලේ සිතියම ද ලබාගෙන පිහිටීම විස්තර කරන්න.

## පාසල හා අවට වටපිටාවේ කාලගුණය (Weather)

විවිධ පරිසරවල පවතින කාලගුණික තත්ත්වය එකිනෙකට වෙනස් විය හැකි ය. ඒ අනුව වර්ෂා සහිත, සුළං සහිත, මීදුම සහිත, උණුසුම්, වියළි වැනි විවිධ කාලගුණික තත්ත්වයන් තිබිය හැකි ය.

ඔබගේ පාසල අවට පරිසරයේ කාලගුණික තත්ත්වය නිරීක්ෂණය කිරීමට මග පෙන්වීම මෙම පාඩමේ අරමුණ යි.




**1.7 රූපය**
**විවිධ කාලගුණික තත්ත්වයන් සහිත ප්‍රදේශ කිහිපයක්**

යම් ස්ථානයක පවතින කාලගුණික තත්ත්වය තවත් ස්ථානයක පවතින කාලගුණික තත්ත්වයට වඩා වෙනස් විය හැකි ය. මෙලෙස විවිධ ස්ථානවල විවිධ කාලගුණික තත්ත්වයන් හඳුනාගත්ත ද දවස තුළ මෙම තත්ත්වයන් ද වෙනස් වීමට පුළුවන. එයට හේතුව අවට පරිසරයේ ස්වභාවය සැමවිට ම ඒකාකාරී නොවන බැවිනි. උදාසන දුටු පරිසරයේ ස්වභාවය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වන බව ගතට දැනෙන වෙනසින් මෙන් ම අවට

පරිසරය හොඳින් නිරීක්ෂණය කිරීමෙන් ද ඔබට වටහා ගත හැකිය. 1.7 රූපය බලන්න.

පරිසරය නිරීක්ෂණය කිරීමේ දී ඔබට පෙනෙන සහ දැනෙන උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං, වලාකුළු යනාදිය කාලගුණික අංග ලෙස හැඳින්වේ.

යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායුගෝලයේ ස්වභාවය කාලගුණය යනුවෙන් හැඳින්වේ.

කාලය හා ප්‍රදේශය අනුව කාලගුණික තත්ත්වය වෙනස්වීම එහි සාමාන්‍ය ස්වභාවය යි. රූපවාහිනී ප්‍රවෘත්ති අවසානයේ දිනපතා ඉදිරිපත් කරන කාලගුණ වාර්තාවෙන් විවිධ ප්‍රදේශවල කාලගුණික වෙනස්වීම් පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කෙරේ. පහත දැක්වෙන්නේ එවැනි කාලගුණ වාර්තාවකි. එය හොඳින් අධ්‍යයනය කරන්න.

අද පෙ.ව. 9.00න් අවසන් වූ පැය 24 තුළ 200mmක උපරිම වර්ෂාපතනය කටුනායකින් ද, $30^{0}$Cක උපරිම උෂ්ණත්වය ත්‍රිකුණාමලයෙන් ද අවම උෂ්ණත්වය වූ $12^{0}$C නුවරඑළියෙන් ද වාර්තා විය. නිරිත දෙසින් හමා එන සුළං නිසා ඉදිරි පැය 24 තුළ දී බස්නාහිර, දකුණ සහ මධ්‍යම කඳුකරයේ බටහිර දෙසට තද වැසි ලැබෙනු ඇත.

**ක්‍රියාකාරකම්**

1. කාලගුණ වාර්තාවෙන් ඉදිරිපත් කෙරෙන කාලගුණික අංග නම් කරන්න.
2. එම වාර්තාවට අනුව උපරිම වර්ෂාපතනය මිලිමීටර කීයද?
3. එහි සඳහන් වී ඇති පරිදි උපරිම හා අවම උෂ්ණත්වය වාර්තා වී ඇති ස්ථාන ලියන්න.
4. රට තුළට සුළං හමා එන දිශාව නම් කරන්න.
5. කාලගුණ වාර්තාව මගින් හෙළි වන කාලගුණික අනාවැකිය (Weather Forecast) කුමක් ද?

**පැවරුම**

විවිධ මාධ්‍ය මගින් ඉදිරිපත් කර ඇති කාලගුණ වාර්තා කිහිපයක් සොයා ගෙන පන්ති කාමරයේ දී ඒවා ඉදිරිපත් කර ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.



4. ර. මු. නී. ස. 190381

ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology) කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත. එයට සම්බන්ධ ප්‍රාදේශීය කාලගුණ මධ්‍යස්ථාන රැසක් ද ඇත. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් විවිධ ස්ථානවල කාලගුණික අංග පිළිබඳ ව දෛනික ව රැස් කර ගන්නා තොරතුරු පදනම් කරගෙන කාලගුණ වාර්තා සකස් කරනු ලැබේ. කාලගුණික අංග මැනීම සඳහා වර්තමානයේ දී දියුණු උපකරණ භාවිත කෙරේ. ඔබ පාසල අවට ප්‍රදේශයේ එවැනි කාලගුණික මධ්‍යස්ථානයක් තිබේදැයි සොයා බලන්න.

කාලගුණය මැනීමට යොදගන්නා ඇතැම් උපකරණ පන්ති කාමරයේ දී ඔබට ද නිර්මාණය කිරීමට පුළුවන. එම උපකරණ භාවිතයෙන් පාසල අවට වටපිටාවේ කාලගුණයේ ස්වභාවය නිරීක්ෂණය කර ඒවායේ වෙනස්කම් වටහා ගන්න.

## උෂ්ණත්වය (Temperature)

- කාලගුණික අංග (weather elements) අතර මූලිකාංගය වන්නේ උෂ්ණත්වය යි.
- උෂ්ණත්වය හා තාපය ලබාදෙන්නේ සූර්යයා ය.
- උෂ්ණත්වමානය මගින් උෂ්ණත්වය මැනීමට පුළුවන. උෂ්ණත්වය මනිනු ලබන්නේ සෙල්සියස් අංශක හෝ ෆැරන්හයිට් අංශකවලිනි.
- අධික සූර්යයතාපයක් හා උෂ්ණත්වයක් ලැබෙන විට වියළි කාලගුණික තත්ත්වයක් ඇති වේ.




1.8 රූපය
උෂ්ණත්වමානය
**(Thermometer)**

**පැවරුම්**


1. පාසල් විද්‍යාගාරයේ ඇති උෂ්ණත්වමානය ඇසුරෙන් පාසල් වත්තේ නිශ්චිත ස්ථානයක් තෝරාගෙන එම ස්ථානයේ උෂ්ණත්වය දෛනික ව හා යම් නිශ්චිත වේලාවන් තුළ මැන සටහන් තබන්න. මෙම ක්‍රියාකාරකම සතියක් හෝ මාසයක් පුරා ඔබට කළ හැකි ය.
2. සකස් කළ වාර්තාව අනුව එම ස්ථානයේ උෂ්ණත්ව වෙනස්කම් පිළිබඳ ව වාක්‍ය තුනක් ලියන්න.

## වර්ෂාපතනය (Rainfall)

- සූර්යතාපය නිසා ගොඩබිම, සාගරය හා ගස්වැල්වල ඇති ජලය, වාෂ්ප බවට පත් වේ.
- එම ජලවාෂ්ප (water vapour) ඉහළ නැග සිසිල් වී ඝනීභවනය (Condensation) වේ.
- ජලවාෂ්ප ඝනීභවනය වීමෙන් වලාකුළු නිර්මාණය වේ. එමගින් වර්ෂාව ලැබේ.
- වර්ෂාමානයක් උපයෝගි කරගෙන වර්ෂාපතනය මැන ගැනීමට පුළුවන. වර්ෂාපතනය මනිනු ලබන්නේ මිලිමීටරවලිනි.




1.9 රූපය
වර්ෂාමානය
**(Rain gauge)**




1.10 රූපය
වර්ෂාව ඇති වන ආකාරය

### ක්‍රියාකාරකම්

1. වර්ෂාව මගින් අපට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.
2. වර්ෂාව ඇති වීමට පෙර හා වර්ෂාවෙන් පසු පරිසරයෙහි දක්නට ලැබෙන ලක්ෂණ වගුවකින් දක්වන්න.

### පැවරුම

ගුරු උපදෙස් ලබාගනිමින් වර්ෂාමානයක් නිර්මාණය කරන්න.

- පැතලි පතුලක් සහිත, විනිවිද පෙනෙන සිලින්ඩරාකාර ප්ලාස්ටික් බෝතලයක් ගෙන කට ප්‍රදේශයෙන් 1/3 කොටසක් වෙන්කර ගන්න.
- කපාගත් කොටස, බඳ කොටස මත පුනීලයක් සේ තබන්න.
- බඳ කොටසේ මිලිමීටර ලකුණු කළ කඩදාසි පටියක් අලවා එය සෙලෝටේප්වලින් ආවරණය කරගන්න.
- එය පාසලේ හෝ නිවසේ එළිමහන් උස් ස්ථානයක තබා යම් කාලසීමාවක් තුළ ඔබ ප්‍රදේශයට ලැබෙන වර්ෂාව මැන දෛනික වාර්තා තබාගන්න.
- දෛනික වාර්තා නිරීක්ෂණය කොට අදාළ ප්‍රදේශයේ වර්ෂාපතනය පිළිබඳ ව වාක්‍ය තුනක් ලියන්න.

## සුළං (Wind)

- පරිසරයේ ස්වභාවය නිරීක්ෂණය කරන විට ගස්වල කොළ අතු සෙලවෙන බව ඔබට පෙනෙනු ඇත. ඔබේ ගතට සිසිලසක් ද දැනෙනු ඇත.
- එසේ වන්නේ සුළං හැමීම සිදු වන බැවිනි.
- සුළං හමා යන දිශාවට අනුව ගස්වල අතු නැමී පවතී.



1.11 රූපය
සුළං දිශා දර්ශකය සහ අනිලමානය (**Wind Direction Indicator and Anemometer**)

- තදින් හමන සුළං, සුළි සුළං (Cyclones), සැඩ සුළං (Storm) ලෙස ද අඩු වේගයකින් හමන සුළං, මඳ සුළං (Mild winds) නමින් ද හැඳින්වේ.
- සුළං දිශා දර්ශකයෙන් සුළං හමන දිශාව පෙන්නුම් කෙරේ.
- සුළඟේ වේගය මැනීමට භාවිත කරන උපකරණය අනිලමානය යි. සුළඟේ වේගය මනිනු ලබන්නේ පැයට කිලෝමීටරවලිනි.

මුහුදු, ගංගා, ඇළදොළ වැනි ජලාශ සහිත ස්ථාන අසල දී සිසිල් සුළඟේ පහස විඳීමට ඔබට පුළුවන.

**පැවරුම**

- ගුරු උපදෙස් ලබා ගෙන සුළං දිශා දර්ශකයක් නිර්මාණය කරන්න.
- පාසල් භූමියේ එළිමහන් ස්ථානයක එය තබා සුළං හමන දිශාව වෙනස් වන අයුරු නිරීක්ෂණය කරන්න.

## වලාකුළු (Clouds)

- අහස දෙස බැලූ විට ඔබට විවිධ හැඩයෙන් සහ වර්ණයෙන් යුත් වලාකුළු දැක ගැනීමට පුළුවන (1.12 රූපය).
- වලාකුළුවල ස්වභාවය ඒවා නිරීක්ෂණය කිරීමෙන් දැකගත හැකි ය.
- වර්ෂාව ඇති වීමට පෙර අහසෙහි අඳුරු පැහැති ඝන වලාකුළු දක්නට ලැබේ.
- අහසේ වලාකුළු නොමැති විට පැහැදිලි නිල් අහසක් දිස් වේ.



1.12 රූපය
**විවිධ හැඩයෙන් යුත් වලාකුළු**

ඉහත තොරතුරු අනුව විවිධ උපකරණ භාවිතයෙන් සහ නිරීක්ෂණ මගින් පාසල අවට වටපිටාවේ කාලගුණික දත්ත රැස් කර ගැනීමට ඔබට හැකියාව ලැබේ.

කාලගුණික අංග, ඒවා මැනීමට භාවිත කරන උපකරණ හා එක් එක් උපකරණ සඳහා යොදා ගනු ලබන මිනුම් ඒකක පිළිබඳ සටහනක් 1.1 වගුවේ දැක්වේ. එය හොඳින් අධ්‍යයනය කරන්න.

1.1 වගුව

**කාලගුණික අංග, උපකරණ සහ මිනුම් ඒකක**

| කාලගුණික අංග | මනින උපකරණ | ඒකකය |
|---|---|---|
| උෂ්ණත්වය | උෂ්ණත්වමානය | සෙල්සියස් අංශක / ෆැරන්හයිට් අංශක |
| වර්ෂාපතනය | වර්ෂාමානය | මිලිමීටර් |
| සුළඟේ වේගය | අනිලමානය | පැයට කිලෝමීටර් |
| සුළං හමන දිශාව | සුළං දිශා දර්ශකය | ඊතලයෙන් දක්වන දිශාව |
| වලාකුළු | නිරීක්ෂණය කිරීමෙන් | ........................................ |

**පැවරුම**

ගුරු උපදෙස් අනුව විවිධ උපකරණ භාවිතයෙන් හා නිරීක්ෂණ මගින් ඔබ නිවස/පාසල අවට පරිසරය පිළිබඳ ව රැස් කර ගත් කාලගුණික දත්ත භාවිත කරමින් නිවස/පාසල අවට ප්‍රදේශයේ කාලගුණය පිළිබඳ ව වාර්තාවක් සකස් කරන්න.

## කාලගුණික තොරතුරු දැනගැනීමෙන්,

- එදිනෙදා කටයුතු මනාව සංවිධාන කර ගැනීමට හැකි වේ.
- අකුණු ගැසීම් සිදුවන කාල මෙන් ම සුළි සුළං, ගංවතුර (floods), නායයාම් (land slides) වැනි තර්ජන ඇති විය හැකි ප්‍රදේශ පිළිබඳ ව කල් ඇති ව දැනුම් දීම නිසා ජීවිත හා දේපළ හානි වළක්වා ගත හැකි ය.
- ධීවරයින්ට හා ගොවීන්ට ඔවුන්ගේ කටයුතු සාර්ථක කර ගැනීමට පුළුවන.

## ක්‍රියාකාරකම්


1. ඔබ අවට පරිසරයේ කාලගුණික ස්වභාවය දැනගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.
2. ඔබ ප්‍රදේශයේ අයහපත් කාලගුණික තත්ත්වයක් තිබේ නම් එම තත්ත්වය මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කර ඉදිරිපත් කරන්න.
3. දී ඇති ඉඟි උපයෝගි කර ගනිමින් ප්‍රහේළිකාව පුරවන්න.

හරහට

2. අහසේ වලාකුළුවල ස්වභාවය මේ මගින් දැනගත හැකි ය.
3. සැහැල්ලු මෙන් ම සෞම්‍ය සුළඟකි.
4. ඝනීභවනය වූ ජලවාෂ්ප මෙලෙස පොළොවට වැටේ.

පහළට

1. සුළඟේ වේගය මැනීමට භාවිත කරයි.
2. ප්‍රධාන කාලගුණික අංගයකි.




## පැවරුම

සතියක් තුළ රූපවාහිනී හෝ වෙනත් මාධ්‍ය මගින් ඉදිරිපත් කරනු ලබන කාලගුණික අනාවැකි කෙරෙහි අවධානය යොමු කර ඒවායින් ප්‍රකාශ වන කාලගුණික වෙනස්වීම් සිදුවන්නේ දැයි විමසිලිමත් ව වාර්තා තබාගන්න.

## පාසල අවට වටපිටාවේ භූ දර්ශනය (Landscape) (කටු සිතියම)

පාසල අවට වටපිටාවේ භූ දර්ශනය විවිධ භූගෝලීය ලක්ෂණවලින් සමන්විත වේ. එම ලක්ෂණ ස්වාභාවික මෙන් ම මිනිසා විසින් නිර්මාණය කළ ඒවා ලෙස වෙන් කළ හැකි ය.

**භූගෝලීය ලක්ෂණ**

| | |
|---|---|
| උස්බිම් | - Highlands |
| උද්‍යාන | - Gardens |
| ගොඩනැගිලි | - Buildings |
| ඇළදොළ | - Streams |
| වගාබිම් | - Cultivated lands |
| වනාන්තර | - Forests |
| මාර්ග | - Roads |
| ගංගා | - Rivers |
| ක්‍රීඩා පිටි | - Play grounds |
| පහත් බිම් | - Lowlands |

**ක්‍රියාකාරකම**

කොටුවේ දක්වා ඇති භූගෝලීය ලක්ෂණ, ස්වාභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද ඒවා ලෙස වර්ග කරන්න.

ඔබගේ පාසල අවට වටපිටාව නාගරික හෝ ග්‍රාමීය පරිසරයක් සහිත වටපිටාවක් විය හැකි ය. කඳුකර ප්‍රදේශ, වෙරළාසන්න ප්‍රදේශ, වගා බිම් ප්‍රදේශ, වැව් හා ගංගා ආශ්‍රිත යනාදී වශයෙන් විවිධ පරිසරවල පාසල් පිහිටා තිබෙනු ඔබ දක ඇත.

පාසලක් අවට පිහිටි භූ දර්ශනයක් 1.13 රූපයෙන් දක්වේ.




1.13 රූපය
**පාසලක් අවට පිහිටි භූ දර්ශනයක්**

## ක්‍රියාකාරකම්

1. 1.13 රූපයෙන් ඔබට හඳුනාගත හැකි භූගෝලීය ලක්ෂණ නම් කරන්න.
2. ඒ අනුව පාසල පිහිටි භූ දර්ශනය පිළිබඳ ව වාක්‍ය පහක් ලියන්න.

චිත්‍රයට නගා ඇති භූ දර්ශනයෙහි කටු සිතියම 1.14 රූපයෙන් දැක්වේ.




1.14 රූපය
**චිත්‍රයට නගා ඇති භූ දර්ශනයේ කටු සිතියම**

චිත්‍රය සහ කටු සිතියම අතර පැහැදිලි වෙනසක් ඇත.

- චිත්‍රයේ ඇතැම් ලක්ෂණ ත්‍රිමාණ ස්වරූපයෙන් (Three dimension) දැක්වේ.
- සිතියමේ එම ලක්ෂණ පැතලි ස්වභාවයකින් පෙන්වා ඇත.
- චිත්‍රයකට වඩා සිතියමකින් භූගෝලීය ලක්ෂණවල පිහිටීම, දුර ප්‍රමාණය හා හැඩය නිශ්චිත ව දැක්විය හැකි ය.

## ක්‍රියාකාරකම්

1. අන්තර්ජාල පහසුකම් හෝ ඡායාරූප භාවිත කරමින් නාගරික හා ග්‍රාමීය පාසල් දෙකක භූ දර්ශන ලබා ගන්න.
2. එම භූ දර්ශනය නිරීක්ෂණය කර හඳුනාගත හැකි වෙනස්කම් තුනක් ලියන්න.

## පැවරුම

1.14 රූපය ආදර්ශයට ගනිමින් පහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන ඔබගේ පාසල අවට භූ දර්ශනයේ කටු සිතියමක් අඳින්න.

සිතියම ඇඳීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- පාසල අවට වටපිටාවේ භූ දර්ශනය හොඳින් නිරීක්ෂණය කරන්න.
- පාසල වටා පිහිටි කඳුවැටි, ගංගා, ඇළදොළ, මාර්ග, වගා බිම්, පොදු ගොඩනැගිලි ආදියෙහි පිහිටීම සහ ඒවායේ ලක්ෂණ කඩදාසියක සටහන් කරගන්න.
- පසුව ඒවාට වර්ණ යොදා භූ දර්ශනය චිත්‍රයට නගන්න.
- චිත්‍රය අනුසාරයෙන් භූ දර්ශනයෙහි කටු සිතියමක් අඳින්න.
- සිතියම ඇඳීමේ දී භූ දර්ශනයේ කැපීපෙනෙන ලක්ෂණ පළමුවෙන් සිතියම්ගත කරන්න. (ගංගා, ඇළදොළ, මාර්ග රටා ආදිය)
- සිතියමේ තොරතුරු දැක්වීමට පහසු සංකේත යොදා ගන්න.
- සිතියමේ උතුරු දිශාව දක්වන්න.
- භූ දර්ශනයේ ලක්ෂණ සිතියමට නැගීමේ දී ඒවායේ විශාලත්වය, හැඩය හා දුර ප්‍රමාණය ගැන ද සැලකිලිමත් වන්න.
- සිතියමේ දක්වෙන ලක්ෂණ හඳුනාගත හැකි වන පරිදි සුචියක් ඇතුළත් කරන්න.

## පාරිභාෂික වචන මාලාව

| | | |
|---|---|---|
| • පිහිටීම | - Location | - அமைவிடம் |
| • පරිපාලන කොට්ඨාසය | - Administrative Division | - நிர்வாகப் பிரிவு |
| • පළාත | - Province | - மாகாணம் |
| • දිස්ත්‍රික්කය | - District | - மாவட்டம் |
| • ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - Divisional Secretariat Division | - பிரதேச செயலாளர் பிரிவு |
| • ග්‍රාම නිලධාරි කොට්ඨාසය | - Grama Niladhari Division | - கிராம சேவகர் பிரிவு |
| • දළ සැලැස්ම | - Plan | - திட்டப்படம் |
| • දිශාව | - Direction | - திசை |
| • මාලිමා යන්ත්‍රය | - Compass | - திசையறிகருவி |

| | | |
|---|---|---|
| • අන්තර්ජාලය | - Internet | - இணையம் |
| • කාලගුණය | - Weather | - வானிலை |
| • මීදුම | - Mist | - பனி |
| • සූර්යතාපය | - Heat | - வெப்பம் |
| • උෂ්ණත්වය | - Temperature | - வெப்பநிலை |
| • වර්ෂාපතනය | - Rainfall | - மழைவீழ்ச்சி |
| • ජලවාෂ්ප | - Water vapour | - நீராவி |
| • වාෂ්පීකරණය | - Evaporation | - ஆவியாதல் |
| • ඝනීභවනය | - Condensation | - ஒடுங்குதல் |
| • සුළං | - Winds | - காற்று |
| • සුළි සුළං | - Cyclones | - சூறாவளி |
| • මඳ සුළං | - Mild winds | - மென்காற்று |
| • සැඩ සුළං | - Storm | - கடுங்காற்று |
| • වලාකුළු | - Clouds | - முகில் |
| • උෂ්ණත්වමානය | - Thermometer | - வெப்பமானி |
| • වර්ෂාමානය | - Rain Gauge | - மழைமானி |
| • සුළං දිශා දර්ශකය | - Wind direction indicator | - காற்று திசைக்காட்டி |
| • අනිලමානය | - Anemometer | - காற்று விசைமானி |
| • සුළඟේ වේගය | - Wind speed | - காற்றின் வேகம் |
| • භූ දර්ශනය | - Landscape | - நிலக்காட்சி |
| • භූගෝලීය ලක්ෂණ | - Geographical features | - புவியியல் அம்சங்கள் |
| • ත්‍රිමාණ ස්වරූපය | - Three dimension | - முப்பரிமாணம் |
| • උත්ස්වේදනය | - Transpiration | - சுவாசித்தல் |
| • වර්ෂණය | - Precipitation | - மழைவீழ்ச்சி |
| • මතුපිට ගලායාම (අපධාවය) | - Surface runoff | - கழிவு நீரோட்டம் |

# 2 නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය

ඔබ, ඔබේ දෙමාපියන් සහ පවුලේ අනෙකුත් සාමාජිකයන් සමග වාසය කරන ගොඩනැගිල්ල නිවස යි. බොහෝ විට ඔබගේ නිවස පිහිටා ඇත්තේ කඳුකර (mountainous), වෙරළ තීර (coastal belts), තැනිතලා (plains), බෑවුම් (slopes), ගංගා සහ වනාන්තර වැනි භෞතික ලක්ෂණ සහිත ග්‍රාමීය, නාගරික හෝ වතු ආශ්‍රිත පරිසරයක විය හැකි ය.

නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය, ශාක හා සත්ත්ව විවිධත්වය, ප්‍රජාවේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

විවිධ පරිසරවල පිහිටා ඇති නිවාස ඇතුළත් 2.1 රූපය හොඳින් නිරීක්ෂණය කරන්න.




2.1 රූපය
විවිධ පරිසරවල පිහිටා ඇති නිවාස

## ක්‍රියාකාරකම්

2.1 රූපය අධ්‍යයනය කර පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

1. පහත දැක්වෙන නිවාසවල පිහිටීමට අදාළ රූප රාමුව තෝරා, ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.

| | |
|---|---|
| 1. ග්‍රාමීය පරිසරයක පිහිටි නිවස | |
| 2. වෙරළ ආශ්‍රිත පරිසරයක පිහිටි නිවස | |
| 3. වතුකරයේ පිහිටි නිවස | |
| 4. කඳුකර බිමක පිහිටි නිවස | |
| 5. තැනිතලා බිමක පිහිටි නිවස | |
| 6. බෑවුම් ප්‍රදේශයක පිහිටි නිවස | |
| 7. නාගරික පරිසරයක පිහිටි නිවස | |
| 8. මද උස් බිමක පිහිටි නිවස | |

2. ඒ එක් එක් නිවාස පිහිටා ඇති භූමියෙහි දක්නට ලැබෙන ලක්ෂණ සහ එම ලක්ෂණ අනුව ඇති විය හැකි වාසි අවාසි පහත දැක්වෙන වගුවෙහි ලියා දක්වන්න.

| නිවස පිහිටි භූමියේ ස්වභාවය | ලක්ෂණ | වාසි | අවාසි |
|---|---|---|---|
| | | | |

3. ඔබගේ නිවස අවට වටපිටාවෙහි භූමියේ ස්වභාවය නිරීක්ෂණය කර එහි දැකිය හැකි ලක්ෂණ මොනවාදැයි සඳහන් කරන්න.

## පැවරුම්

1. ඔබගේ පන්තියේ ළමුන් කණ්ඩායමක් තෝරාගෙන ඔවුන්ගේ නිවාස අවට වටපිටාවෙහි භූමියේ ස්වභාවය පිළිබඳ තොරතුරු සොයා භූමියෙහි විවිධත්වය හඳුනා ගන්න.

| නම | තැනිතලා | වෙරළ ආශ්‍රිත | උස්බිම් | බෑවුම් ප්‍රදේශ |
|---|---|---|---|---|
| කමල් | | | √ | |

2. එවැනි වටපිටාවක ජීවත්වීමේ ඇති වාසි හා අවාසි සාකච්ඡා කර ඉදිරිපත් කරන්න.

නිවස පිහිටියේ කුමන භූමි ප්‍රදේශයක වුව ද එම භූමිය ආරක්ෂා කරගැනීම ඔබ අප කාගෙත් යුතුකමක් සේම වගකීමක් ද වේ. එමෙන් ම නිවස අවට පරිසරය අලංකාර කිරීමේ දී වුව ද එය ඉතාමත් ප්‍රවේශමෙන් කළ යුතු ය. අවිධිමත් ආකාරයට භූමිය පරිහරණය නොකළ යුතු ය.

## ශාක හා සත්ත්ව විවිධත්වය

නිවස අවට පරිසරයේ විවිධත්වයක් ඇති වීම කෙරෙහි විවිධ ශාක වර්ග හා සත්ත්ව විශේෂ හේතු වේ. ශ්‍රී ලංකාවේ භූමියේ ස්වභාවය මෙන් ම දේශගුණික බලපෑම නිසා එක් එක් පරිසර පද්ධති (eco-systems) තුළ විවිධ ශාක වර්ග හා සත්ත්ව විශේෂ දක්නට ලැබේ. ජීවීන්ගේ පැවැත්ම සඳහා ශාක ඉතා ප්‍රයෝජනවත් වේ. ඔබ ග්‍රාමීය පරිසරයක වාසය කරන්නේ නම් ශාක බහුල ව තිබිය හැකි ය. ඔබ නාගරික පරිසරයක වාසය කළ ද විවිධ ශාක වර්ග සිටුවීමෙන් ඔබගේ නිවස ආසන්න වටපිටාව අලංකාර කරගෙන තිබීමට පුළුවන. ශාක වර්ග තෝරා ගැනීමේ දී අලංකාරය පමණක් නොව පරිසරයට ගැළපෙන මිනිසාගේ සෞඛ්‍යයට හිතකර ශාක වර්ග තෝරා ගැනීමට ද සැලකිලිමත් විය යුතු ය.


අව්ව, වැස්ස, සතුරු උවදුරු, රෝග ආදියට මුහුණ දෙමින් ඒවා ජය ගනිමින් ඔවුන්ගේ ජීවිත පවත්වා ගෙන යන සත්ත්ව විශේෂ ද අප අවට පරිසරයෙහි ම කොටසක් ලෙස සැලකිය හැකි ය. මිනිසාගේ පැවැත්මට සත්ත්ව ප්‍රජාව ද ශාක වර්ග මෙන් ම වැදගත් වේ.

ඔබගේ නිවස අවට පරිසරයේ ඇතැම් කාලවල දී විශේෂ කුරුලු වර්ග දැකගත හැකි ය. සමහර කුරුලු විශේෂ (species of birds) අවුරුද්දේ එක් කාලයක දී පමණක් දක්නට ලැබේ. සිංහල අවුරුදු කාලයේ දී ඇසෙන කොහාගේ නාදය ඔබට හුරුපුරුදු ය. ඇතැම් විට ශීත රටවලින් එම දැඩි ශීතල දරාගත නොහැකි ව පැමිණෙන පක්ෂීන් ද දක්නට ලැබේ. මෙවැනි පක්ෂීන් සංචාරක පක්ෂීන් වේ. සිවුරු හොරා, සුදුරෙදි හොරා, අවිච්චියා එවැනි සංචාරක පක්ෂීන් සඳහා නිදසුන් වේ.




**2.2 රූපය**
**සංචාරක පක්ෂීන්**

සතුන්ගෙන් හා ශාකවලින් අපට ලැබෙන ප්‍රයෝජන සහ අවට පරිසරයට ඇති වන විවිධ බලපෑම් 2.3 රූපයෙන් දක්වා ඇත.






ඇටිකුකුළා - වගාවන්ට හානි කරන ගොළුබෙල්ලන් විනාශ කිරීම.

වේයා - විවිධ අපද්‍රව්‍ය කැබලි කොට ඒවා දිරාපත් වීමට උදව් වීම.

ගැඩවිල් පණුවා - පස බුරුල් කිරීමට හා පස සරු කිරීමට දායක වීම.

වවුලා - ගස්වල බීජ ව්‍යාප්තියට සහාය වීම.

බත්කූරා - කුඹුරුවලට හානි කරන කෘමීන් විනාශ කිරීම.

කපුටා - කුණු කසල කා දැමීම.

ගිරවා - පරිසරයට සෞන්දර්යයක් එක් කිරීම.

2.3 රූපය

**සතුන්ගෙන් හා ශාකවලින් ලැබෙන ප්‍රයෝජන සහ පරිසරයට ඇති වන බලපෑම්**

## ක්‍රියාකාරකම්

1. ඔබගේ නිවස අවට පරිසරයෙහි දක්නට ලැබෙන සත්ත්ව විශේෂ හා ශාක වර්ග වගුවකට ඇතුළත් කරන්න.

| සත්ත්ව විශේෂ | ශාක වර්ග |
|---|---|
| | |

2. එම ශාක වර්ගවලින් ලබාගත හැකි ප්‍රයෝජන හඳුනා ගැනීමට පහත වගුවෙහි අදාළ තීරුව තුළ √ සලකුණ යොදන්න. එක් ශාක වර්ගයකින් ප්‍රයෝජන කිහිපයක් ම ලබා ගැනීමට ද පුළුවන.

| ප්‍රයෝජන | | | | | |
|---|---|---|---|---|---|
| ශාකවර්ගය | ආහාර | ඖෂධ | ගෘහභාණ්ඩ සෑදීම | විසිතුරු භාණ්ඩ | වෙනත් |
| | | | | | |

3. ශාකවලින් මිනිසාට, සතුන්ට හා පරිසරයට ලබාගත හැකි ප්‍රයෝජන තුන බැගින් ලියන්න.


4. පින්තූරයේ දැක්වෙන සතුන් පහත වගුවේ සඳහන් ආකාරයට කාණ්ඩවලට ඇතුළත් කරන්න.



| | |
|---|---|
| 1. එල හට ගැනීමට අවශ්‍ය පරාගණය කරන කෘමීන් | |
| 2. මිනිසාට විවිධ ලෙඩ රෝග බෝ කිරීමට හේතු වන සතුන් | |
| 3. රාත්‍රියේ හැසිරෙන සතුන් | |
| 4. මිනිසාට හානි ගෙන දෙන විෂ සහිත උරගයින් | |

5. පහත දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

1. පරිසරයට අලංකාරයක් ගෙනදේ.
2. විෂ සහිත සර්පයෙකි.
3. සංචාරක පක්ෂියෙකි.
4. මැලේරියාව, ඩෙංගු වැනි රෝග බෝ කරයි.
5. පස සරු කිරීමට දායක වේ.
6. නීති මගින් ආරක්ෂා කරගත යුතු සත්ත්වයෙකි.
7. කාලගුණ අනාවැකි (weather forecasts) පළ කරයි.
8. මහාමාරිය රෝගය ඇති කරයි.
9. ගොවිතැනට උපකාරි වනවා මෙන් ම නිවසට ආදායමක් ද ගෙනදේ.
10. වගාවන්ට හානි කරන ගොළුබෙල්ලන් විනාශ කරයි.




## පැවරුම

පාසල/නිවස අවට පරිසරයේ ශාක සිටුවමින් පරිසරය ආරක්ෂා කරගැනීමට ඔබ ද දායකවන්න.

- උපන්දිනය, අලුත් අවුරුද්ද, ජාතික රුක් රෝපණ දිනය වැනි විශේෂිත දින සඳහා ඔබගේ ගෙවත්තේ හෝ පාසල් භූමියෙහි හෝ විවිධ පැළ වර්ග සිටුවීමට කටයුතු කරන්න.

# පාසල/ නිවස අවට වටපිටාවේ මානව ක්‍රියාකාරකම්

## පාසල/නිවස අවට ප්‍රජාව හඳුනා ගැනීම

ඔබ ජීවත්වන පරිසරය තුළ ඔබේ පවුල හැරුණ විට විවිධ ජනවර්ග හා ආගම්වලට අයත් පවුල් ගණනාවක් සිටීමට පුළුවන. ඔවුන් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි විවිධ ජනවර්ගවලට අයත්වනවා මෙන් ම බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් වැනි විවිධ ආගම් අදහන්නන් විය හැකි ය. එම ජනවර්ග හා ආගම් සමග බැඳුණු සිරිත් විරිත් සමුදයක් පවතී. කෙතරම් විවිධතා තිබුණ ද ඒ සියලු දෙනා ම ඔබගේ අසල්වාසීන් ය. ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට මෙන් ම අන්‍යෝන්‍ය සහජීවනයෙන් ජීවත්වීමට අප පුරුදු විය යුතු ය. ක්‍රීඩා කටයුතු, විවිධ සමිති සමාගම්, සුභසාධන කටයුතුවල දී ජාති ආගම් භේද නොතකා සියලු දෙනා ම එකමුතු වී කටයුතු කිරීම නිදසුන් ලෙස දැක්විය හැකි ය.



**2.4 රූපය**

**විවිධ ආගමික සංකේත හා ආගමික සිද්ධස්ථාන**

**ක්‍රියාකාරකම්**

1. 2.4 රූපයෙහි දැක්වෙන ආගම් හඳුනාගෙන එම ආගම් හා සම්බන්ධ උත්සව ඇතුළත් වන සේ පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ආගම් | උත්සව |
|---|---|---|
| නිදසුන් | බෞද්ධ, ........................... | වෙසක්, පොසොන්, .................................. |

2. ඔබ නිවස පිහිටි ප්‍රදේශයේ ජීවත්වන විවිධ ජනවර්ග හා ඔවුන් අදහන ආගම් සඳහන් කරන්න.
3. විවිධ ජාතික හා ආගමික උත්සවවල දී ඔබ අසල්වාසීන් සමග සහයෝගයෙන් කටයුතු කරන ආකාරය පෙන්වීමට නිදසුන් තුනක් දක්වන්න.
4. ඔබ ප්‍රදේශයේ ප්‍රජාවගේ දියුණුව උදෙසා පිහිටුවා ගෙන ඇති සමිති සමාගම් තුනක් නම් කර ඒවායින් ඉටු කෙරෙන කාර්යයන් දෙක බැගින් ලියන්න.
5. ඔබ ප්‍රදේශය නගාසිටුවීමට ප්‍රජාව සාමූහික ව කටයුතු කරන අවස්ථාවක් චිත්‍රයට නගන්න.

**පැවරුම**


විවිධ ජනවර්ගවලට හා ආගම්වලට අයත් උත්සව අවස්ථාවක් නිරූපණය වන සේ  චිත්‍රයක් නිර්මාණය කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

## පාසල/ නිවස අවට ආර්ථික කටයුතු

ප්‍රදේශයක ආර්ථික කටයුතු බොහෝ දුරට එම ප්‍රදේශයේ සම්පත් මත රඳා පවතී. කෘෂිකාර්මික, කාර්මික හා සේවාවන් එම ආර්ථික කටයුතු අතර ප්‍රධාන වේ.

## කෘෂිකාර්මික කටයුතු

කෘෂිකාර්මික භූමි පරිභෝගය යටතේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල භෝග වගා කිරීම, සත්ත්වපාලනය හා ධීවර කර්මාන්තය ද සිදු කෙරේ. විවිධ භූ ලක්ෂණ හා දේශගුණික ලක්ෂණවලින් යුත් අප රටෙහි විවිධ ප්‍රදේශවලට සුවිශේෂී වූ කෘෂිකාර්මික කටයුතු දක්නට ලැබේ. 2.5 රූපය බලන්න.




2.5 රූපය

විවිධ ප්‍රදේශවලට සුවිශේෂී වූ කෘෂිකාර්මික කටයුතු හා එම ප්‍රදේශවල වගා කරන භෝග වර්ග

ඔබ ප්‍රදේශයේ ද භූමිය ප්‍රයෝජනයට ගනිමින් භූමියේ ස්වභාවය අනුව විවිධ භෝග වගා කර තිබෙන්නට පුළුවන. තැනිතලා ප්‍රදේශවල පොල් වගාව, ගංගා නිම්න ප්‍රදේශවල වී වගාව, කඳුකර ප්‍රදේශවල තේ හා රබර් වගාව නිදසුන් ලෙස දැක්විය හැකි ය.

ඔබ ප්‍රදේශයට ආසන්න ව සාගර, ගංගා, ජලාශ සහ වැව් පිහිටා තිබේ නම් ධීවර කර්මාන්තය මිනිසුන්ගේ ජීවනෝපාය විය හැකි ය. එමෙන් ම ගවයන්, ඌරන්, කුකුළන් වැනි සතුන් ඇති කරමින් සත්ත්ව පාලනය ජීවනෝපාය කරගන්නා අය ද සිටීමට පුළුවන.

### ක්‍රියාකාරකම

ඔබ පාසල/නිවස අවට ප්‍රදේශයේ වගා කෙරෙන භෝග වර්ග සහ සත්ත්වපාලනය යටතේ ඇති කරනු ලබන සතුන් නම් කරන්න.

### පැවරුම්

1. ඔබගේ ගෙවත්තේ සහ පාසල් භූමියෙහි වගා කර ඇති හා වගා කළ හැකි භෝග පහත සටහනට අනුව ලියා දක්වන්න.

| | ධාන්‍ය | අලවර්ග | එළවළු | පලතුරු | වෙනත් |
|---|---|---|---|---|---|
| වගාකර ඇති භෝග | | | | | |
| වගා කළ හැකි භෝග | | | | | |

2. ඔබගේ ගෙවත්තේ හෝ පාසල් භූමියෙහි භෝග වගා කිරීමේ දී ඔබට දැයක විය හැකි අවස්ථා තුනක් ලියන්න.

### කාර්මික කටයුතු

කෘෂිකර්මාන්තය හැරුණු විට ඔබ ප්‍රදේශයෙන් සපයා ගත හැකි විවිධ අමුද්‍රව්‍ය යොදාගෙන කරනු ලබන විවිධ කර්මාන්ත ද තිබීමට පුළුවන. නිදසුනක් ලෙස නිවසේ ඇති ගෘහ භාණ්ඩ නිවස අවට පරිසරයෙන් ලබාගත් දැව උපයෝගි කරගෙන ඔබ ප්‍රදේශය තුළ ම නිෂ්පාදනය කරනු ලැබූ ඒවා විය හැකි ය. එමෙන් ම මැටි උපයෝගි කරගෙන වළං, උළු හා ගඩොල් වැනි නිෂ්පාදන ද, සිමෙන්ති උපයෝගි කරගෙන සිමෙන්ති ගල්, මල්පෝච්චි වැනි නිෂ්පාදන ද සිදු කිරීම මේ සඳහා තවත් නිදසුන් වේ.



2.6 රූපය
ප්‍රදේශයේ සම්පත් මත පදනම් වූ කර්මාන්ත

බොහෝ ප්‍රදේශවල එම ප්‍රදේශයෙන් ම ලබා ගත් ස්වාභාවික සම්පත් (natural resources) උපයෝගි කර ගනිමින් විවිධ වූ කර්මාන්ත කරනු ලැබේ. එසේ ම ගෘහ ආශ්‍රිත ව කරනු ලබන කුඩා පරිමාණ කර්මාන්ත ද ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම වාගේ ව්‍යාප්ත ව ඇත. රස කැවිලි නිෂ්පාදනය, සහල් ආශ්‍රිත නිෂ්පාදන, ඇඳුම් මැසීම, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිදසුන් ලෙස දැක්විය හැකි ය.

2.1 වගුව
පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත

| කර්මාන්ත | ප්‍රදේශ |
|---|---|
| ලී බඩු | මොරටුව |
| වෙස් මුහුණු | අම්බලන්ගොඩ |
| පිත්තල භාණ්ඩ | පිළිමතලාව |
| වේවැල් භාණ්ඩ | රදාවඩුන්න |
| පැදුරු | දුම්බර |

එමෙන් ම පාරම්පරික ශිල්ප ඥානය (traditional technology) පදනම් කරගෙන කරනු ලබන කර්මාන්ත සඳහා ප්‍රසිද්ධ වූ ප්‍රදේශ ද අප රටෙහි දක්නට ලැබේ. 2.1 වගුව බලන්න.




**2.1 සිතියම**
**පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත කිහිපයක පිහිටීම**

## ක්‍රියාකාරකම්

1. ඔබ ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කර්මාන්ත තුනක් නම් කර ඒවායින් ඔබ ප්‍රදේශයට ලැබී ඇති වාසි මොනවා දැයි දක්වන්න.
2. වගුවෙහි සඳහන් තොරතුරු පදනම් කරගනිමින් එක් එක් කර්මාන්ත පිහිටා ඇති ප්‍රදේශ, දිස්ත්‍රික්ක හා පළාත් ගළපා සකස් කර නැවත ලියන්න.

| කර්මාන්තය | ප්‍රදේශය | දිස්ත්‍රික්කය | පළාත |
|---|---|---|---|
| වෙස්මුහුණු<br>පිත්තල භාණ්ඩ<br>පැදුරු<br>උළු, ගඩොල් | පිළිමතලාව<br>අම්බලන්ගොඩ<br>බංගදෙණිය<br>දුම්බර | ගාල්ල<br>මහනුවර<br>පුත්තලම | දකුණ<br>මධ්‍යම<br>වයඹ |

### පැවරුම

ඔබ ප්‍රදේශයේ ස්වාභාවික සම්පත් ඇසුරු කරගෙන කළ හැකි කර්මාන්ත ආශ්‍රයෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| කර්මාන්ත | ස්වාභාවික සම්පත් |
|---|---|
| | |

## සේවා කටයුතු

පාසල හා නිවස අවට වටපිටාවේ පවත්නා ආර්ථික කටයුතු අතර සේවා කටයුතු ද වැදගත් වේ. මිනිස් අවශ්‍යතා යම් ආයතනයක් මගින් ඉටු කරනු ලබන්නේ නම් එය සේවාවක් ලෙස හැඳින්විය හැකි ය. ඔබ ප්‍රදේශයේ මෙන් ම ඕනෑම ප්‍රදේශයක සෞඛ්‍යය, අධ්‍යාපන, තැපැල්, ප්‍රවාහන, බැංකු, ආරක්ෂක වැනි සේවාවන් දක්නට ලැබේ. 2.7 රූපයෙන් එසේ සපයනු ලබන සේවාවන් කිහිපයක් දක්වා ඇත.

මෙම සේවාවන්ගෙන් කිහිපයක් රජය මැදිහත් වී නොමිලේ ලබා දෙන අතර ඇතැම් සේවාවන් පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යනු ලැබේ.

රජය මැදිහත් වී සහනදායී මිලකට ලබාදෙන සේවාවන් ද ඇත. නිදසුන් ලෙස ප්‍රවාහනයේ දී වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම, රාජ්‍ය ඔසුසල මගින් සහනදායී මිලකට ඖෂධ වර්ග ලබා දීම නිදසුන් ලෙස දැක්විය හැකි ය.

ප්‍රදේශයේ ජනතාවට එදිනෙදා ජීවන කටයුතු පවත්වාගෙන යාම සඳහා මෙම සේවාවන් ප්‍රයෝජනවත් වේ.



**2.7 රූපය**
**විවිධ සේවා**

ඔබගේ ප්‍රදේශයේ ජනතාව ද මෙවැනි සේවා සැපයීමේ කාර්යයෙහි නිරත ව සිටීමට පුළුවන. කායික මානසික වශයෙන් ශ්‍රමය වැය කරමින් කෘෂිකාර්මික, කාර්මික හෝ යම් සේවාවක නිරත ව සිටී නම් ඒ සියලු දෙනාගෙන් ම සිදුවන්නේ විශාල සමාජ මෙහෙවරකි. එමෙන් ම විවිධ වූ වෘත්තීන්හි නිරතවන්නෝ කුමන ආකාරයකින් හෝ සමාජය ගොඩනැගීමට දායක වෙති.

## ක්‍රියාකාරකම්

1. ඔබ ප්‍රදේශයේ පවත්නා විවිධ සේවාවන් හා ඒවායින් ඉටුකරන කාර්යයන් දෙක බැගින් ලියන්න.
2. පාසල් සිසුවකු වශයෙන් ඔබ භුක්ති විඳින සේවාවන් තුනක් නම් කරන්න.
3. එම සේවාවන් භුක්ති විඳීමේ දී ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් මොනවාදැයි ලියා දක්වන්න.

## පාරිභාෂික වචන

| | | |
|---|---|---|
| • පරිසරය | - Environment | - சூழல் |
| • භූමියේ ස්වභාවය | - Nature of the land | - நிலத்தின் இயல்பு |
| • නිරීක්ෂණය | - Observation | - அவதானித்தல் |
| • මානුෂ පරිසරය | - Human environment | - மனித சூழல் |
| • භෞතික පරිසරය | - Physical environment | - பௌதிகச் சூழல் |
| • ශාක විවිධත්වය | - Plant diversity | - தாவர பல்வகைமை |
| • සත්ත්ව විවිධත්වය | - Animal diversity | - விலங்குப் பல்வகைமை |
| • ප්‍රජාව | - Community | - சமூகம் |
| • වෙරළ තීර | - Coastal belt | - கரையோரம் |
| • තැනිතලා | - Plains | - சமவெளி |
| • බෑවුම් | - Slopes | - சாய்வுகள் |
| • කඳුකර බිම් | - Mountainous lands | - உயர் நிலம் |
| • පද්ධතිය | - System | - தொகுதி |
| • දේශගුණික බලපෑම් | - Climatic effects | - காலநிலைத் தாக்கங்கள் |
| • ජීවීන් | - Organisms | - அங்கி |
| • ග්‍රාමීය පරිසරය | - Rural environment | - கிராமச் சூழல் |
| • නාගරික පරිසරය | - Urban environment | - நகரச் சூழல் |
| • සත්ත්ව ප්‍රජාව | - Animal community | - விலங்குச் சமூகம் |
| • සංචාරක පක්ෂීන් | - Migrant birds | - இடம்பெயர் பறவைகள் |
| • කුරුළු විශේෂ | - Birds species | - பறவைகளின் இனங்கள் |
| • වායුගෝලය | - Atmosphere | - வளிமண்டலம் |
| • අපද්‍රව්‍ය | - Waste | - கழிவு |
| • බීජ / ඵල | - Seeds | - விதை |
| • කෘමීන් | - Insects | - பூச்சிகள் |
| • පරාගණය | - Pollination | - மகரந்தம் |
| • උරගයින් | - Reptiles | - ஊர்வன |
| • ස්වාභාවික සෞන්දර්යය | - Natural beauty | - இயற்கை அழகு |
| • පාංශු සංරක්ෂණය | - Soil conservation | - மட்பாதுகாப்பு |
| • සහජීවනය | - Coexistence | - சக ஜீவனம் |
| • ජනවර්ග | - Ethnic group | - இனப்பிரிவு |
| • ජීවනෝපාය | - Occupation | - தொழில் |
| • ආර්ථික කටයුතු | - Economic activities | - பொருளாதார நடவடிக்கைகள் |
| • කෘෂිකාර්මික කටයුතු | - Agricultural activities | - விவசாய நடவடிக்கைகள் |
| • ගං මිටියාවත | - River valley | - நதிப் பள்ளத்தாக்கு |
| • තෙත් කලාපය | - Wet zone | - ஈரவலயம் |
| • වියළි කලාපය | - Dry zone | - உலர் வலயம் |
| • අතරමැදි කලාපය | - Intermediate zone | - இடைவலயம் |
| • අවිධිමත් | - Informal | - முறைசாராத |
| • අමුද්‍රව්‍ය | - Raw materials | - மூலப்பொருட்கள் |
| • ශිල්ප ඥානය | - Technological skills | - கலைஞானம் தொழில்நுட்பம் |


# 3 තම නිවස අවට වටපිටාව යහපත් ව පවත්වා ගැනීම

නීරෝගිමත් ජීවිතයක් ගතකිරීම සඳහා ඔබගේ නිවස අවට වටපිටාව යහපත් ව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. භූමිය, ජලය, පස, ශාක, සත්ත්වයින් හා වායුගෝලය ඔබගේ නිවස අවට ස්වාභාවික පරිසරයේ ඇති මූලිකාංග වේ. මිනිසා දැනුමෙන් දියුණුවත් ම පරිසරයේ මූලිකාංග කෙරෙහි කරනු ලබන බලපෑම ද අධික වී තිබේ. මේ නිසා ඔබගේ නිවස අවට පරිසරයේ ද විවිධ ගැටලු පැන නැගී තිබෙන්නට පුළුවන. එබැවින් නිවස අවට පරිසරය යහපත් ව පවත්වා ගනිමින් පරිසරය සංරක්ෂණය කරගැනීමට දායක වීම ඔබගේ යුතුකමකි.

තම නිවස අවට වටපිටාවෙහි ඇති ස්වාභාවික මූලිකාංග හඳුනා ගැනීම හා අවට පරිසරය යහපත් ව පවත්වා ගැනීම පිළිබඳ ව අවබෝධයක් ලබා දීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

## භූමිය

පරිසරයේ මූලිකාංගයක් වන භූමිය, විවිධ අයුරින් ප්‍රයෝජනයට ගන්නා ආකාරය 3.1 රූපයෙන් දැක්වේ.




3.1 රූපය
භූමිය සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගන්නා ආකාරය

ඔබගේ පාසල් භූමිය මෙන් ම ගෙවත්ත සැලසුම් සහගත ව සකස් කර විධිමත් ලෙස පරිහරණය කිරීමෙන් නිවස අවට වටපිටාව ද යහපත් ව පවත්වා ගැනීමට පුළුවන.

**නිවස අවට භූමිය විධිමත් ව පරිහරණය කිරීම සඳහා පහත දැක්වෙන කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න.**

- පස සෝදා යන ස්ථාන සොයා කාණු කැපීම, ආවරණ භෝග වැවීම හෝ ගල්වැටි දැමීම
- දහයියා, කොහුබත්, පිදුරු වැනි වැස්මක් යෙදීම.
- කොම්පෝස්ට් පොහොර වලක් සාදා මුළුතැන්ගෙයින් ඉවතලන ද්‍රව්‍ය, කොළ රොඩු එකතු කර පොහොර සාදා ගැනීම.

ඔබගේ නිවස අවට ප්‍රදේශයේ ඇති සම්පත් භාවිතයට ගැනීමේ දී පරිසරයේ විවිධ වෙනස්කම් සිදුවිය හැකි ය.

එවැනි වෙනස්කම් පරිසරයට හානි නොවන අයුරින් සිදු කිරීමට ඔබගේ අවධානය යොමුවිය යුතු ය.




3.2 රූපය
භූමිය විධිමත් ව පරිහරණය කිරීම

**පැවරුම්**

1. ඔබගේ ගෙවත්තේ හෝ පාසල් භූමියේ කොටසක් තෝරා ගෙන විධිමත් ව එම බිම් කොටස පරිහරණය කළ හැකි ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කරන්න.
2. ගුරු උපදෙස් ලබාගෙන එම සැලැස්ම ක්‍රියාවට නගන්න.

භූමිය අවිධිමත් ලෙස පරිහරණය කෙරෙන ආකාරය හා ඉන් ඇති වන ප්‍රතිවිපාක 3.3 රූපයෙන් දැක්වේ.




3.3 රූපය
භූමිය අවිධිමත් ලෙස පරිහරණය කිරීම හා ඉන් ඇති වන ප්‍රතිඵල

**ක්‍රියාකාරකම්**

1. ඔබ නිවස අවට වටපිටාවේ භූමිය ප්‍රයෝජනයට ගෙන ඇත්තේ කුමන කටයුතු සඳහා ද?
2. එම භූමි පරිහරණ ක්‍රම නිසා භූමියට සිදු වී ඇති හානි තුනක් සඳහන් කොට ඒවා අවමකර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

## ජලය

විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා භාවිතයට ගන්නා ජලය, ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය වූ ස්වාභාවික සම්පතකි. ජලය භාවිතයට ගන්නා විවිධ අවස්ථා 3.4 රූපයෙන් දැක්වේ.



3.4 රූපය
ජලය භාවිතයට ගන්නා විවිධ අවස්ථා

## ක්‍රියාකාරකම්

1. 3.4 රූපය නිරීක්ෂණය කර ජලය භාවිතයට ගන්නා අවස්ථා සඳහන් කරන්න.
2. ඔබගේ නිවැසියන් විවිධ අවශ්‍යතා සඳහා ජලය ලබාගන්නා ක්‍රම (මූලාශ්‍ර) සඳහන් කරන්න.
3. ජලය ප්‍රයෝජනයට ගැනීමේ දී ජල නාස්තිය සිදු වන අවස්ථා නිදසුන් සහිත ව දක්වන්න.

අවිධිමත් ලෙස ජලය පරිභෝජනයට ගන්නා ආකාරය 3.5 රූපයෙන් දැක්වේ. මෙලෙස ජලය අපතේ යාම නිසා නොයෙකුත් ගැටලු ඇති විය හැකි ය.



3.5 රූපය
**අවිධිමත් ජල පරිභෝජන අවස්ථා**

3.1 වගුව

**ජලය හිඟවීමෙන් ඇති විය හැකි ගැටලු සහ ජල සම්පත තිරසාර ව පවත්වා ගැනීම (Sustainability) සඳහා ගත හැකි පියවර**

| ජලය හිඟවීමෙන් ඇති විය හැකි ගැටලු | ජලය තිරසාර ව පවත්වා ගැනීම සඳහා ගත හැකි පියවර |
|---|---|
| • පානීය ජලය හිඟ වීම.<br>• ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වීම.<br>• කෘෂිකාර්මික හා කාර්මික කටයුතු අඩාල වීම.<br>• ලෙඩරෝග ව්‍යාප්ත වීම.<br>• පස නිසරු වීම.<br>• ජලවිදුලිබල නිෂ්පාදනය අඩාල වීම. | • නාස්තිය හා අපතේ හැරීමෙන් වැළකීම.<br>• අරපිරිමැස්මෙන් භාවිතය පිළිබඳ සැලකිලිමත් වීම.<br>• පානීය ජලය අපිරිසිදු කිරීමෙන් වැළකී සිටීම.<br>• වන වැස්ම ආරක්ෂා කිරීම හා ශාක සිටුවීමට පෙලඹවීම.<br>• ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම හා දූෂණය වීම වැළැක්වීම.<br>• ජල සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම.<br>• ගෘහස්ථ ජල පරිහරණයේ දී අපතේ යන ජලය වෙනත් දෙයකට යොදවා ගැනීම.<br>• වැසි ජල ටැංකි භාවිතයට හුරු කිරීම. |

**ක්‍රියාකාරකම්**

01. 3.6 රූපය නිරීක්ෂණය කොට ජල දූෂණය (water pollution) සිදුවිය හැකි ක්‍රම තුනක් ලියන්න.

02. ජල දූෂණය නිසා සිදු විය හැකි අහිතකර ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න.

03. ජල දූෂණය වැළැක්වීම සඳහා යෙදිය හැකි උපක්‍රම හතරක් ඉදිරිපත් කරන්න.

04. අවිධිමත් ජල පරිහරණය වළක්වාලීමට ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

විවිධ මානව ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණයට ලක්වන අවස්ථා 3.6 රූපයෙන් දැක්වේ.

**ජල දූෂණය**



**3.6 රූපය**
**අවට පරිසරයේ ජලය දූෂණය වන අවස්ථා**

## වාතය

ඔබ අප කාගේත් පැවැත්ම සඳහා ජලය මෙන් ම වාතය ද අත්‍යවශ්‍ය සාධකයකි. වායුගෝලයේ පවත්නා වායුවර්ග අතරින් ශ්වසනයට අවශ්‍ය ඔක්සිජන් වායුවත්, ශාක වර්ධනයට අවශ්‍ය නයිට්‍රජන් වායුවත් වඩාත් වැදගත් වේ. විවිධ මානුෂ ක්‍රියාකාරකම් නිසා අප අවට ඇති වායුව දූෂණය වෙමින් පවතී. 3.7 රූපය බලන්න. එලෙස වායුව දූෂණය වීමේ ප්‍රතිඵල මිනිසාට පමණක් නොව සතුන්ට හා ශාකවලට ද අහිතකර ලෙස බලපානු ලැබේ.

## වායු දූෂණය (Air pollution)



3.7 රූපය
වායුව දූෂණය වන අවස්ථා

### ක්‍රියාකාරකම්

01. 3.7 රූපය නිරීක්ෂණය කොට වායුව දූෂණයට ලක්විය හැකි අවස්ථා නම් කරන්න.

02. දූෂිත වායුව (polluted air) ආශ්වාස කළ විට ඔබට අත්විඳීමට සිදු වන අපහසුතා සඳහන් කරන්න.

## වායු දූෂණය නිසා ඇති වන ප්‍රතිඵල

වායු දූෂණය නිසා ඇති වන අහිතකර ප්‍රතිඵල දෙකක් පහත දැක්වේ.

1. ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග ඇති වීම
   - කැස්ස
   - පෙණහලු පිළිකා
   - පීනස
   - ඇදුම
   - තද හිසරදය
2. අම්ල වැසි ඇති වීම
   - ජලය දූෂණය වීම
   - ජලජ ජීවීන් විනාශ වීම
   - වන විනාශය
   - පසට හානි සිදු වීම

**පැවරුම්**

01. ඔබගේ නිවස හා පාසල අවට පරිසරයෙහි භූමිය, ජලය හා වායුව දූෂණය කෙරෙන මානව ක්‍රියාකාරකම් පිළිබඳ ව තොරතුරු රැස් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| ස්වාභාවික පරිසරයේ මූලිකාංග | අවිධිමත් මානව ක්‍රියාකාරකම් | එහි ප්‍රතිඵල | හානිය/දූෂණය අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| භූමිය<br>ජලය<br>වායුව | | | |

02. භූමිය, ජලය, වායුව දූෂණය වීමෙන් වළක්වා ගැනීම හා සංරක්ෂණය කිරීම යන තේමා යටතේ පෝස්ටර් නිර්මාණය කොට පාසල් භූමිය තුළ ප්‍රදර්ශනය කරන්න.

# බලශක්තිය (Energy)

උදෑසන අවදි වූ මොහොතේ සිට විවිධ කාර්යයන් ඉටුකර ගැනීමට අපි විවිධ බලශක්ති ප්‍රභව භාවිත කරන්නෙමු. ආහාර පිළියෙල කිරීම, පවිත්‍ර කිරීම, සන්නිවේදන උපකරණ භාවිතය, ආලෝකය ලබාගැනීම, ප්‍රවාහනය ආදී කාර්යයන් රැසකට බලශක්තිය උපකාරී වේ. අප ලබාගන්නා සියලු ම බලශක්තිවල මූලික ප්‍රභවය වන්නේ සූර්යයා ය.

අතීතයේ දී මිනිසා තම කාය ශක්තිය ද පසුව සත්ත්වයින් ද විවිධ කාර්යයන් කිරීමට උපයෝගි කරගෙන තිබේ. මිනිසා සහ සත්ත්වයින් එම කාර්යයන් කිරීමට අවශ්‍ය ශක්තිය ආහාර මගින් ලබාගන්නා අතර යන්ත්‍ර සූත්‍රවලට අවශ්‍ය ශක්තිය, ඉන්ධන, විදුලිය හෝ වෙනත් ක්‍රම මගින් ලබාගනී.

## බලශක්ති ඉල්ලුම ඉහළ යාමට හේතු

- ජන සංඛ්‍යාව වැඩි වීම
- පාරිභෝගික අවශ්‍යතා ඉහළ යාම
- කාර්මික කටයුතුවල වර්ධනය
- ප්‍රවාහන දියුණුව
- ජීවන තත්ත්වය උසස් වීම

ඔබගේ නිවසේ ද විවිධ කාර්යයන් සඳහා ජල විදුලිය (hydroelectricity), ඛනිජ තෙල් (mineral oil), ස්වභාවික ගෑස් (natural gas), සූර්ය ශක්තිය (solar power) (සූර්ය කෝෂ - solar cells) හා දව වැනි බලශක්ති ප්‍රභව භාවිත කිරීමට පුළුවන. නිවසේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බලශක්තිය පරිහරණය කිරීමේ දී එය ඉතාමත් කාර්යක්ෂම ව හා ක්‍රමවත් ව අරපිරිමැස්මෙන් කිරීමට පුරුදු විය යුතු ය.

## නිවසේ බලශක්තිය පරිහරණය කිරීමේ දී,

- අවශ්‍ය තැනට හා අවශ්‍ය අවස්ථාවට පමණක් විදුලි පහන් දැල්වීම.
- වඩාත් කාර්යක්ෂමතාවක් ලබාදෙන විදුලි පහන් භාවිත කිරීම. (ප්‍රසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන (Compact Fluorescent Lamp - CFL) , ආලෝක විමෝචක ඩයෝඩය (Light Emitting Diode - LED) වැනි විදුලි පහන්)
- ශීතකරණය භාවිතයේ දී දොර අරින වාරගණන සහ දොර හැර තැබීමේ කාලය හැකි තරම් අඩු කිරීම.
- හැකි සෑම විට ම මැදීමට අවශ්‍ය රෙදි එකවර මැද ගැනීම.
- තාපය අපතේ නොයන දර ලිප් භාවිතය
- ආහාර පිසීමෙන් පසු ලිප නිවා දැමීම (දර ලිප)
- ගෑස් ලිප භාවිතයේ දී ඒ සඳහා සකස් කරන ලද විශේෂිත භාජන භාවිත කිරීම
- වාහන භාවිතයේ දී ඉන්ධන අරපිරිමැස්ම සඳහා සැලසුම් සහගත ව කාර්යයන් කිහිපයක් එකවර සිදු කර ගැනීම.

3.8 රූපයෙන් විවිධ බලශක්ති ප්‍රභවයන් ද බලශක්තිය යොදාගන්නා විවිධ අවස්ථා ද දැක්වේ.




3.8 රූපය

**විවිධ බලශක්ති ප්‍රභව සහ බලශක්තිය යොදාගන්නා අවස්ථා**

## ක්‍රියාකාරකම්

01. 3.8 රූපයෙන් දැක්වෙන බලශක්ති ප්‍රභව, ප්‍රයෝජනයට ගන්නා අවස්ථා එම රූපයෙන් තෝරා ලියන්න.

02. ඔබ නිවසේ විවිධ කාර්යයන් සඳහා භාවිත කරන බලශක්ති ප්‍රභව නම් කරන්න.

03. එම බලශක්ති ප්‍රභව භාවිතයේ දී අපතේ යන අවස්ථා සඳහන් කරන්න.

## බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම

60W විදුලි බල්බයක් මගින් අප ලබාගන්නා ආලෝකය නිවැරදි ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කරන ලද 11W CFL බල්බයක් මගින් ලබාගත හැකි ය. 60W බල්බ පහක් වෙනුවට 11W CFL බල්බ පහක් යෙදුවහොත් 245W විදුලිය ඉතිරි වේ.



**3.9 රූපය**
**ප්‍රසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන (CFL බල්බය)**

100W විදුලි බල්බයක් මගින් ලබාගන්නා ආලෝකය නිවැරදි ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කරන ලද 9W LED බල්බයකින් ලබාගත හැකි ය.



**3.10 රූපය**
**ආලෝක විමෝචක ඩයෝඩය (LED බල්බය)**

දර අඩුවෙන් යොදා ගනිමින් ආරක්ෂාකාරී ව පහසුවෙන් මෙන් ම කඩිනමින් ඉවුම් පිහුම් කිරීමට කාර්යක්ෂම දර උදුන උපකාරී වේ.



**3.11 රූපය**
**කාර්යක්ෂම දර උදුනක්**

බලශක්ති අවශ්‍යතා සඳහා වැදගත් වූ විකල්ප ශක්තියක් ලෙස ජීව වායුව (Bio-gas) හැඳින්විය හැකි ය. අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් ගෘහස්ථ පරිභෝජනය සඳහා සකස් කර ගත් ජීව වායු ඒකකයක් (bio-gas unit) 3.12 රූපයෙන් දැක්වේ. මුළුතැන්ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය, නිවස අවට පරිසරයේ ඇති සැල්වීනියා, දිය හබරල, ග්ලිරිසීඩියා (Gliricidia) වැනි ශාක වර්ග කුඩාවට කපන ලද පිදුරු, ගොම දියර වැනි දේ, ඒ සඳහා භාවිත කළ හැකි ය.

මෙම ජීව වායු ඒකකයෙන් නිවසට විදුලිය මෙන් ම වරින් වර ඉවත් කරන අපද්‍රව්‍ය ගෙවත්තේ එළවළු කොටුවට සාරවත් පොහොරක් ලෙස ද භාවිත කළ හැකි වේ.



3.12 රූපය
ජීව වායු ඒකකයක් සහ එයින් ලබා ගත හැකි
ප්‍රයෝජන

සූර්ය කෝෂ මගින් සූර්ය ශක්තිය අවශෝෂණය (absorption) කර එයින් බලශක්තිය නිපදවා නිවසේ බලශක්ති අවශ්‍යතා සපුරාගත හැකි ය. මේ සඳහා දැරීමට සිදුවන මූලික වියදම අධික වුව ද සෙසු බලශක්ති භාවිතයේ දී මෙන් පරිසර හානි සිදු නොවේ.



3.13 රූපය
සූර්ය කෝෂ

## ක්‍රියාකාරකම්

1. පහත සඳහන් ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| 1. අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන ජීව වායු උත්පාදනය කළ හැකි ය. | |
| 2. ජීව වායුවෙන් නිවසට ආලෝකය ලබාගත හැකි වුව ද ඉවුම් පිහුම් කළ නොහැකි ය. | |
| 3. ජීව වායු ජනකයකින් ඉවත් කරන අපද්‍රව්‍ය ගෙවත්තේ එළවළු කොටුවට දැමීම නුසුදුසු ය. | |
| 4. විදුලි බල්බ ගණනාවකට එක ම ස්විචයක් භාවිත කිරීමෙන් විදුලි නාස්තිය අවම කර ගත හැකි ය. | |
| 5. විදුලි බිල අඩු කර ගත හැකි ක්‍රමයක් ලෙස ප්‍රසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන් (CFL) දැල්වීම කළ හැකි ය. | |
| 6. බොරතෙල් ආශ්‍රයෙන් පෙට්‍රල්, ඩීසල් මෙන් ම ගෑස් ද ලබා ගැනීමට පුළුවන. | |

2. විදුලි බල්බ/රූපවාහිනිය/ලිප භාවිත කිරීමේ දී ඒ සඳහා යොදගත හැකි විකල්ප බලශක්ති නම් කරන්න.

3. ඔබ නිවසේ පාවිච්චි කරන විදුලිය පිරිමසා ගැනීම සඳහා ඔබට සහ ඔබගේ පවුලේ සාමාජිකයන්ට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

## පැවරුම්

| වේලාව | ප.ව 3.30 - ප.ව 6.00 | | | | | ප.ව 6.00 - ප.ව 9.00 | | | | | ප.ව 9.00 - ප.ව 10.00 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දල්වූ විදුලි බුබුළු සංඛ්‍යාව | රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කළ කාල සීමාව | විදුලි ඉස්ත්‍රික්කය භාවිත කළ කාල සීමාව | විදුලි පංකාව ක්‍රියාත්මක කළ කාල සීමාව | ආහාර සකස් කිරීමේ උපකරණ භාවිත කළ කාල සීමාව | දල්වූ විදුලි බුබුළු සංඛ්‍යාව | රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කළ කාල සීමාව | විදුලි ඉස්ත්‍රික්කය භාවිත කළ කාල සීමාව | විදුලි පංකාව ක්‍රියාත්මක කළ කාල සීමාව | ආහාර සකස් කිරීමේ උපකරණ භාවිත කළ කාල සීමාව | දල්වූ විදුලි බුබුළු සංඛ්‍යාව | රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කළ කාල සීමාව | විදුලි ඉස්ත්‍රික්කය භාවිත කළ කාල සීමාව | විදුලි පංකාව ක්‍රියාත්මක කළ කාල සීමාව | ආහාර සකස් කිරීමේ උපකරණ භාවිත කළ කාල සීමාව |
| <u>දිනය</u><br>සඳුද<br>අඟහරුවාද<br>බදාද<br>බ්‍රහස්පතින්ද<br>සිකුරාද<br>සෙනසුරාද<br>ඉරිද | | | | | | | | | | | | | | | |

ඉහත වගුව උපයෝගි කරගෙන ඔබගේ නිවසේ විදුලිය පරිහරණය කරන අවස්ථා සටහන් කරන්න. ඔබ රැස් කරගත් තොරතුරු උපයෝගි කරගෙන ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

1. ඔබගේ නිවසේ වැඩි වශයෙන් භාවිත කරන විදුලි උපකරණය කුමක් ද?
2. වැඩි ම කාල සීමාවක් භාවිතයට ගෙන ඇති විදුලි උපකරණ, කාල සීමාව අනුව අනුපිළිවෙළින් ලියන්න.
3. ඔබගේ සටහනට අනුව නිවසේ විදුලි උපකරණ පරිහරණය කිරීම පිළිබඳ ඔබට ඉදිරිපත් කළ හැකි වෙනත් කරුණු මොනවා ද?

4. ඔබ නිවසේ භාවිත කරන වෙනත් බලශක්ති වර්ග මොනවා ද?
5. නිවසේ විදුලිය පිරිමසා ගැනීම සඳහා ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා මොනවා ද?

## අපද්‍රව්‍ය (waste materials) බැහැර කිරීම

නිවසේ දී මෙන් ම නිවස හා පාසල අවට පරිසරයෙන් ද අප ඉවතලන ද්‍රව්‍ය බොහෝ ය. ඒවා අපද්‍රව්‍ය ලෙස හැඳින්වේ. එම අපද්‍රව්‍ය ජනනය වන මූලාශ්‍ර අනුව ගෘහස්ථ, කෘෂිකාර්මික හා කාර්මික ලෙස වර්ග කළ හැකි ය. මෙම අපද්‍රව්‍ය ගෙවත්තේ යම් තැනක එකතු කර තැබීමට හෝ වල දැමීමට හෝ කුණු ගොඩකට දැමීමට බොහෝ විට අප පුරුදු ව සිටින්නෙමු. එහෙත් දිරාපත් නොවන අපද්‍රව්‍ය එසේ බැහැර කිරීම පරිසරයට අහිතකර වේ. ජනසංඛ්‍යාව අධික වීමත්, ඉඩකඩ සීමිත වීමත් නිසා නාගරික පරිසරය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම ගැටලුවක් වී තිබේ. අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීමෙන් නිවස අවට පරිසරයේ භූමිය, ජලය සහ වායුව දූෂණය වේ. එමගින් සිදු වන හානිය වළක්වා ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමුවිය යුතු ය. ඒ සඳහා,

- භාවිතයට ගත හැකි ද්‍රව්‍ය නැවත භාවිතයට ගැනීම. (Reuse)
  නිදසුන් :- පෙළපොත්, ඇසුරුම් පෙට්ටි (අයිස්ක්‍රීම් වැනි), වීදුරු බෝතල් යනාදිය
- ප්‍රතිචක්‍රීකරණය (Re-cycle) - පොලිතින්, ප්ලාස්ටික් වැනි දිරාපත් නොවන අපද්‍රව්‍ය එක්රැස් කර, වර්ග කර, ප්‍රතිචක්‍රීකරණ ආයතනවලට බාරදීමෙන් ආදායමක් ලබාගැනීම සහ ඒවායින් නැවත භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
- නොදිරන ද්‍රව්‍ය අවම වශයෙන් භාවිතයට ගැනීම. (Reduce)
  නිදසුන් :- පොලිතින් ඇසුරුම් මලු, ප්ලාස්ටික් භාණ්ඩ යනාදිය
- ඉවතලන අපද්‍රව්‍ය භාවිතයට ගෙන විවිධ නිර්මාණ තනාගැනීම.
  නිදසුන් :- පොල්කටු - පොල්කටු හැඳි, විසිතුරු භාණ්ඩ
  විදුලි බුබුළු - ලාම්පු
  රෙදි කැබලි - පාපිසි, කුෂන් කවර
- මුළුතැන්ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, කොළරොඩු යනාදිය යොදා ගනිමින් ජීව වායු ඒකකයක්, කොම්පෝස්ට් පොහොර වලක් සකස් කිරීම.

- අවශ්‍ය ප්‍රමාණයට සහ රුචියට ගැළපෙන පරිදි ආහාර සකස් කර ගැනීමෙන් අපද්‍රව්‍ය ලෙස ඉවතලන ආහාර ප්‍රමාණය අඩු කර ගැනීම. එමගින් පවුලේ ආර්ථික තත්ත්වය ද යහපත් මට්ටමක පවත්වා ගැනීමට හැකි වේ.
- අපද්‍රව්‍ය නිසිපරිදි බැහැර කිරීම




3.14 රූපය
අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම

## ක්‍රියාකාරකම්

1. ඔබ නිවස හා අවට පරිසරයෙන් ඉවතලන ද්‍රව්‍ය ඇතුළත් ලේඛනයක් පිළියෙල කරන්න. ඒවා පහත සඳහන් කාණ්ඩ යටතේ වර්ග කරන්න.

| ගෘහස්ථ අපද්‍රව්‍ය | කෘෂි අපද්‍රව්‍ය | කාර්මික අපද්‍රව්‍ය |
|---|---|---|
| | | |

2. ඉහත සඳහන් අපද්‍රව්‍ය දිරාපත් වන හා දිරාපත් නො වන අපද්‍රව්‍ය ලෙස වෙන් කරන්න.

3. ඒවා ප්‍රයෝජනයට ගෙන අමතර ආදායමක් ලබාගත හැකි ක්‍රම සඳහන් කරන්න.

4. එසේ එක්රැස්වන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

**පැවරුම**

නිවස හා ගෙවත්තෙන් ඉවතලන දිරාපත් වන ද්‍රව්‍ය එක්රැස් කොට කොම්පෝස්ට් පොහොර වලක් සකස්කරගෙන ප්‍රයෝජනයට ගන්න.

## පාරිභාෂික වචන


- ඛනිජ සම්පත් - Mineral resources - கனிய வளங்கள்
- සංරක්ෂණය - Conservation - பேணிக் பாதுகாத்தல்
- නියගය - Drought - வரட்சி
- ගංවතුර - Floods - வெள்ளப்பெருக்குகள்
- පාංශු ඛාදනය - Soil erosion - மண்ணரிப்பு
- වායු දූෂණය - Air pollution - வளிமாசடைதல்
- අම්ල වැසි - Acid rains - அமிலமழை
- බලශක්තිය - Energy - சக்தி
- සන්නිවේදනය - Communication - தொடர்பாடல்
- සූර්ය ශක්තිය - Solar power - சூரியசக்தி
- සූර්ය කෝෂ - Solar cells - சூரிய கலங்கள்
- බලශක්ති ප්‍රභව - Energy sources - சக்தி மூலாதாரங்கள்
- ජීව වායු ඒකකය - Bio Gas Unit - உயிரியல் வாயுப் பகுதி
- ප්‍රතිචක්‍රීකරණ - Recycling - மீள் சுழற்சி
- කෘෂි බිම් - Agricultural lands - விவசாய நிலங்கள்
- ජල පරිභෝජනය - Water consumption - நீரின் நுகர்வு
- තිරසර පැවැත්ම - Sustainability - நிலைபேண்
- වන වැස්ම - Forest cover - காட்டுப்போர்வை
- විකල්ප බලශක්ති - Alternative energy - பதிலீட்டு சக்தி
- ප්‍රසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන් - Compact Fluorescent Light - கச்சிதமான ஒளியுள்ள மின்குமிழ்
- ආලෝක විමෝචක ඩයෝඩය - Light Emitting Diode - ஒளிரும் வெப்ப மின்னனுக்கருவி

# 4 ශ්‍රී ලංකාවේ පිහිටීම

ශ්‍රී ලංකාව, ඉන්දියන් සාගරයේ ඉන්දියාවට දකුණින් පිහිටා ඇති දූපතකි. එය ලෝකයේ විශාලතම මහාද්වීපය (continent) වන ආසියා මහාද්වීපයට අයත් වේ. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් වෙන් වන්නේ පටු මුහුදු තීරයකිනි. 32kmක් පමණ වූ මෙම මුහුදු තීරය පෝක් සමුද්‍ර සන්ධිය (Palk strait) නමින් හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ පිහිටීම හා ඒ අනුව ඇති වී තිබෙන විවිධ බලපෑම් පිළිබඳ ව අවබෝධයක් ලබාදීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව, එහෙත් වෙන් ව පිහිටා තිබීම නිසා අනන්‍ය වූ දේශගුණික, දේශපාලනික හා ආර්ථික ලක්ෂණවලින් සමන්විත වේ. (4.1 සිතියම)




**4.1 සිතියම**
**ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව දූපතක් ලෙස පිහිටීම**

# ශ්‍රී ලංකාවේ පිහිටීම,

## දේශගුණයට බලපාන ආකාරය

- දූපතක් ලෙස පිහිටීම නිසා ඉන්දියන් සාගරයේ සිට හමන සුළං මගින් උෂ්ණත්වය සමනය වීම හා වර්ෂය මුළුල්ලේ ම වාගේ වර්ෂාව ලැබීම.
- ඉන්දියානු උප මහාද්වීපයේ සිට හමා එන වියළි සුළංවල බලපෑම නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ යාම.
- මෝසම් සුළංවල බලපෑමෙන් වර්ෂාව ඇති වීම

## ආර්ථිකයට බලපාන ආකාරය

- ශ්‍රී ලංකාව අතීතයේ දී මෙන් ම වර්තමානයේ ද පෙර අපර දෙදිග නැව් මාර්ගයේ මධ්‍යස්ථානයක් වීම.
- ශ්‍රී ලංකාවේ වරායන් ජාත්‍යන්තර වෙළෙඳාමේ දී වැදගත් වීම.
- ආකර්ෂණීය ස්ථාන (attractive places) තිබීම නිසා සංචාරක කර්මාන්තය (Tourist industry) දියුණු වීම.
- බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් නව ආර්ථික රටා බිහි වීම.

## සංස්කෘතියට බලපාන ආකාරය

- ඉන්දියාව, අරාබිය වැනි රටවලින් විවිධ ජන සමූහ සංක්‍රමණය වීම නිසා විවිධ ජනවර්ග, ආගම් හා භාෂා ඇති වීම.
- බටහිර ජාතීන්ගේ පැමිණීමත් සමග ඔවුන්ගේ විවිධ සංස්කෘතික අංග ජන සමාජයට මිශ්‍ර වීම.

**ක්‍රියාකාරකම**

4.3 සිතියම අධ්‍යයනය කරමින් පහත සඳහන් ප්‍රකාශවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(බෙංගාල, ඉන්දියන්, මන්නාරම්, පෝක්, ආසියාව)

1. ශ්‍රී ලංකාව අයත් වන්නේ විශාල ම මහාද්වීපය වූ ......................... ට යි.
2. ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් අතර ......................... බොක්ක පිහිටා ඇත.
3. ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් වෙන්වන්නේ ........................... සමුද්‍ර සන්ධියෙනි.
4. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ............................. සාගරයෙහි ය.
5. ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පිහිටා ඇති මුහුදු ප්‍රදේශය ........................... බොක්ක නමින් හැඳින්වේ.

# ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම

රටක සාපේක්ෂ පිහිටීම (relative location) යනු එම රට, අවට රටවල්, මහාද්වීප, මුහුදු හා සාගරවල පිහිටීම සමග සම්බන්ධ කර හඳුනා ගැනීම යි.

**ඒ අනුව ශ්‍රී ලංකාව,**

- ආසියා මහාද්වීපයේ දකුණින් ද
- ඉන්දියන් සාගරයේ උතුරින් ද
- ගිනිකොන දිග ආසියාවට බටහිරින් ද
- අප්‍රිකානු මහාද්වීපයට නැගෙනහිරින් ද පිහිටා තිබේ. (4.2 සිතියම)




**4.2 සිතියම**
**ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම**

**ක්‍රියාකාරකම**

ඔබ පාසලේ ඇති ආදර්ශ ගෝලය (globe) ආධාර කරගනිමින් ඉහත සඳහන් කරුණු අධ්‍යයනය කරන්න.




4.3 සිතියම
ලෝක සිතියම ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම

**ක්‍රියාකාරකම**


ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව පිහිටීම නිසා මෙරට ජන සමාජයේ ඇති වූ වෙනස්කම් සඳහන් කරන්න.

## ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන


වර්තමාන ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ වේගයෙන් දියුණු වන රටකි. ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍රවල සිදු වන ප්‍රගතිය එයට හේතු වී ඇත. මේ අතර කැපී පෙනෙන සංවර්ධන ව්‍යාපෘති කිහිපයකි.

- නව වරායන්, නව ගුවන් තොටුපළවල් හා අධිවේගී මාර්ග (express ways) ඉදිවීම
- නාගරික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන කිහිපයක් පිළිබඳ තොරතුරු පහත සිතියමෙන් දැක්වේ.





4.4 සිතියම
ශ්‍රී ලංකාවේ වැදගත් ස්ථාන




4.5 සිතියම

කොළඹ - මාතර, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය

මූලාශ්‍රය - මාර්ග සංවර්ධන අධිකාරිය 03/08/2015




**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
   - මත්තල හා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් (International airports)
   - කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල හා හම්බන්තොට වරායන්
   - ගාල්ල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, කුරුණෑගල, යාපනය, මහනුවර හා කොළඹ නගර
2. "ශීඝ්‍රයෙන් දියුණු වන ශ්‍රී ලංකාව" යන මාතෘකාව යටතේ කෙටි විස්තරයක් ලියන්න.

## ලෝකයේ වෙනත් දූපත්

විවිධ ප්‍රමාණයේ දූපත් විශාල සංඛ්‍යාවක් ලෝකය පුරා පිහිටා ඇත. එවැනි දූපත් කිහිපයක් සහ ඒවායේ විශාලත්වය 4.6 සිතියමෙන් දක්වේ.




**4.6 සිතියම**

**ලෝකයේ දූපත් කිහිපයක් හා ඒවායේ විශාලත්වය**

මූලාශ්‍රය - *http://en.wikipedia.org /21/07/2014*

## ක්‍රියාකාරකම්

1. 4.6 සිතියම නිරීක්ෂණය කොට එහි දක්වා ඇති දූපත් ලෝක ආකෘති සිතියමක ලකුණු කොට නම් කරන්න.
2. විශාලත්වය අනුව එම දූපත් පෙළගස්වා ඉදිරියෙන් විශාලත්වය සටහන් කරන්න.

## පැවරුම

සිතියම් පොතක් ආධාරයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| දූපතේ නම | පිහිටා ඇති සාගරය |
|---|---|
| ජපානය | |
| නවසීලන්තය | |
| මාලදිවයින | |
| අයිස්ලන්තය | |
| බ්‍රිතාන්‍ය | |
| සීෂෙල්ස් | |

### පාරිභාෂික වචන

- දූපත - Island - தீவு
- සාපේක්ෂ පිහිටීම - Relative location - சார்பமைவிடம்
- සමුද්‍ර සන්ධිය - Strait - நீரிணை
- මෝසම් සුළං - Monsoon winds - பருவக்காற்றுக்கள்
- උප මහාද්වීපය - Sub Continent - துணைக் கண்டம்
- සංක්‍රමණ - Migration - இடப்பெயர்வு
- ආදර්ශ ගෝලය - Globe - பூகோளம்
- අධිවේගී මාර්ග - Express ways - அதிவேகப்பாதைகள்
- කේන්ද්‍රස්ථානය - Centre - மையம்
- වාරි ශිෂ්ටාචාරය - Hydrulic civilization - நீரியல் நாகரிகம்
- වාණිජ මධ්‍යස්ථානය - Commercial centre - வர்த்தக மையம்
- ආර්ථික මධ්‍යස්ථානය - Economic centre - பொருளாதார மையம்
- ජාත්‍යන්තර වරාය - International harbour - சர்வதேச துறைமுகம்
- ප්‍රදීපාගාරය - Lighthouse - வெளிச்ச வீடு